# 2018/05/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

මෙදින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය -**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම් කේ ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ එච් වී අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ් ජී නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී වි සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච් ජී තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච් කේ ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන් ජී ගයාන් මදුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රී |
| 14. | එඩේර ආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපේ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රී |
| 19. | එම්. එම්. දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන් ඩබ් පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ කේ අයි නේරංජලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 23. | කේ ඒ සී දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 24. | එච් එච් ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 25. | ඩබ් කේ නෙලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 26. | වී ජී අරුණ ශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 27. | පී ජී රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

ආගම සිහිකිරීමෙන් අනතුරුව රට දැය වෙනුවෙන් ජීවිතය පූජා කරමින් අපේ භෞතික අඛණ්ඩතාවය ආරක්ෂා කල රණවිරුවන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ඥාතී හිතයිෂීන්

තමන්ගේ මියගිය දේශපාලන නායකයින් ඒ වගේම සභාව නියෝජනය කරමින් අප හැර ගිය සභාපතිතුමන්ලා සහ සභා නියොජිතයින් සිහිපත් කිරීමට විනාඩියක නිශ්ශබ්දතාවයක් මම අපේක්ෂා කරනවා.

**02. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව**

ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඇතළු ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. සිංහළ අවුරුදු නිවාඩුවත් ගත කර, වෙසක් සැමරුමත් සිදු කර එහි ආශිර්වාදයත් ලබා ගෙන ඉන් අනතුරුව පවත්වනු ලබන පළමු සභා වාරයේදී ගරු මන්ත්‍රී මණ්ඩලය පිළිගැනීම මාගේ යුතුකමක් වශයෙන් සළකනවා. එ අනුව නැවත වරක් ගරු උප සභාපතිතුමා ඇතළු මන්ත්‍රී මණ්ඩලය මම ඉතාමත් ගෞරවයෙන් පිලිගනු ලබනවා. අද දින අප විසින් රැස්වූ මේ සභාවේ කටයුතු බල ප්‍රදේශයේ දියුණුව උදෙසා ගෙන එන යෝජනාවලින් මන්විතව ඉතාමත් සාර්ථකව පැවැත්වීමට ඔබ සැමගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මාගේ කතාව අවසන් කරනවා.

**03. 2018.04.04 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇතිනම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම,**

පසුගිය වර්තාවේ නිවැරදි කිරීම් නැත.

මෙහිදී ගරු උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා නැගී සිටිමින් පසුගිය සභා වාර්තාව පිළිබදව තම අදහස් ප්‍රකාශ කර සිටිමින්,

මම මේ අවස්ථාවේදී ඒ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස යෝජනා කරනවා. ඒ වගේම ඒ වාර්තාව වෙනත් සභාවලට වඩා ඉතා සරලව උකහා ගත හැකි ලෙසත්, අවබෝධ කර ගත හැකි ලෙසත් සකස් කිරීම පිළිබදව මම අගය කොට සලකනවා. 1991 වර්ෂයෙන් පසුව අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අතට ලැබුනු හොදම වාර්තාව තමයි මේක. එය සකස් කිරීමේ ක්‍රමවේදය පිළිබදව මා නැවත වරක් අගය කරනවා. මන්ත්‍රීවරුන් ප්‍රකාශ කල කරුණු අතුරින් 90% ක පමණ ප්‍රමාණයක් මෙම වාර්තාව තුල අන්තර්ගත වෙනවා. ඒක ඇත්තටම දක්ෂතාවයක්. ඒ නිසා මම මෙම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස යෝජනා කරනවා.

ඒ අනුව 2018-04-04 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත හැකි බවට ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**04. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම.**

නැත.

**05. විශේෂ නිවේදන**

1. වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් සියළුම මන්ත්‍රීවරුන් එම වත්කම් බැරකම් භාර දෙන ලෙස දන්වා සිටිමි.
2. මන්ත්‍රීවරුන්ගේ විස්තර පුරවා එවීමට අප විසින් ඔබ වෙත එවන ලද ආකෘති පත්‍රය භාර නොදුන් සියළුම මන්ත්‍රීවරුන් එම තොරතුරු ඉතා කඩිනමන් ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා තිබේ.
3. ප්‍රාදේශීය සභාව නමින් ලියාපදිංචි කර පවත්වා ගෙන යා හැකි සමිතියක් සෑම කොට්ඨාශයකම එක බැගින් ආරම්භ කල හැකි අතර එම සමිතිවලට ප්‍රජා මූල සංවිධාන සමිති ලෙස ලියාපදිංචිය ලබා දිය හැකි වේ. ඒ අනුව සෑම කොට්ඨාශයකටම එක බැගින් ප්‍රජා මූල

සංවිධාන සමිත් අරම්භ කර ඒ හරහා මහජන ඉල්ලීම් ඉටු කර දීමට පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වා ඇත.

4. නිවාස මට්ටමින් කසළ කළමනාකරණය දිරිමත් කිරිම සදහා කොම්පෝස්ට් බදුන් 50 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇත. එක් බදුනක මිළ රු. 1250.00 ක් වැනි සහනදායි මිළකට ලබා දෙන අතර සියළුම මන්ත්‍රීවරුන්ට අවශ්‍ය බදුන් ප්‍රමාණ ය මුදල් ගෙවා ලබා ගත හැකි බව දන්වා සිටිමි.
5. බද්දේගම ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අරුණ ජයසේකර මැතිතුමාගේ හදවත් සැත්කම සදහා මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධව බද්දේගම ප්‍රාදේශීය සභාව මගින් අංක බාප්‍රාස/4/1/5 හා 2018.0502 දිනැති ලිපිය සභාගත කරන ලදී.
   එම රෝගී තත්වය සදහා රු. 1,000,000.00 කට ආසන්න මුදලක් වැය වන බැවින් එතුමා එම රෝගී තත්වයෙන් මුදවා ගැනීමට ගරු මන්ත්‍රීතුමන්ලාගේ දායකත්වය ලබා දෙන මෙන් දන්වා සිටිමි.
6. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අංක RSCS/06(I) හා 2018/04/18 දිනැති ගාල්ල දිස්ත්‍රික්කයේ 2018 වර්ෂය සදහා අර්ධ නාගරික ප්‍රදේශවල කුඩා නගර ග්‍රාමීය ජල ව්‍යාපෘති ඉදිකිරීම සම්බන්ධ ලිපියට සභාගත කරන ලදී.
   ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන WASSip ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පානීය ජලය නොමැති පවුල් සදහා කුඩා නගර ජලව්‍යාපෘති හදුනා ගත යුතුව ඇති බැවින් බල ප්‍රදේශයේ ජලය නොමැති අර්ධ නාගරික ප්‍රදේශවල පවුල් සදහා කුඩා නගර ජල ව්‍යාපෘති අවශ්‍ය නම් ඒ බව දැනුම් දෙන ලෙස ඉහත ලිපිය මගින් දැනුම් දී ඇත.
   ඒ අනුව ජල යෝජනා ක්‍රම අවශ්‍ය ජන කොටස පිළිබද තොරතුරු ලබා දෙන ලෙස සියළුම මන්ත්‍රීවරුන් හට දැනුම් දුනි
7. පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන සංවර්ධන කටයුතු යන කරුණ යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 3/1/1/56 හා 2018/04/19 දිනැති ලිපිය සභබාගත කරන ලදී.
   එම ලිපියට අනුව සභා අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් එනම් මාර්ග හා වෙනත් ඉදිකිරීම් සියල්ල සදහා මහා සභාවට ඉදිරිපත් කර සභා සම්මත කර ගත යුතු බවත්, එම තීරණය ඇතුළත් සභා රැස්වීම් වාර්තාව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශයට යොමු කල යුතු බව දන්වා ඇත. මෙහිදී එම ඉදිරිපත් කරන වැඩසටහන් කමිටු රැස්වීම මගින් අනුමත කරවා ගැනීම වලංගු නොවන බවද දන්වා ඇත.
   ඉදිරියේ සභා අනුමැතිය යටතේ සංවර්ධන යෝජනා යැවීමට තීරණය විය.
8. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන / I Road හා මාර්ග සංවර්ධනය කිරිමේදී හා මාර්ග නඩත්තු කිරිමේදී ඇතිවන ගැටළු විසදාගැනීම යන කරුණ යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 3/5/8/16 හා 2018/04/05 දිනැති ලිපිය සභාගත කරන ලදී.
   එම ලිපියට අනුව ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනෙන් ව්‍යාපෘති අංශ විසින් I Road ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මාර්ගවල නඩත්තු කටයුතු කිරීමේදී මුහුණ පා ඇති ගැටළු දක්වා ඇති අතර ඒ පිළිබදව එම ලිපිය මගින් දැනුවත් කරන ලදී. I Road ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මාර්ග වල දිගුකාලීන පැවැත්ම සදහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසද දන්වා සිටින ලදී.
9. මාර්ග සංවර්ධනය කිරිමේදී හා මාර්ග නඩත්තු කිරිමේදී ඇතිවන ගැටළු විසදා ගැනීම යන කරුණු යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ අංක RDA/ADB/I ROAD-sp/cs/03 හා 2018.02.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

10. උඩවැලිවිටිය ප්‍රජා ශාලාවේ නඩත්තු කටයුතු පවරා ගැනීම යන කරුණ යටතේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක NAG/DEV/3/3/iii/ග්‍රා යටි.සහ වසා (2017) 58 (ii) හා 2018/04/25 දිනැති ලිපිය සභාගත කරන ලදී.
ඒ අනුව ග්‍රාමීය යටිතල පහසුකම් වැඩසටහන 2017 යටතේ උඩවැලිවිටිය ප්‍රජා ශාලාවේ වැඩ නිම කර ඇති අතර එහි ඉදිරි නඩත්තු කටයුතු ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන බවට එම ලිපිය මගින් දැනුම් දී තිබුණි.

ඒ අනුව ඉහත කරුණට පක්ෂව බොහෝ මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කලේය.

මෙහිදී ලක්රුවන් මන්ත්‍රීතුමන් විසින් ප්‍රජා ශාලාව පිහිටි ඉඩම ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් බව ප්‍රකාශ කර සිටියේය.

ඉනෝකා විජේවර්ධන මන්ත්‍රීතුමිය විසින් එම උඩවැලිවිටිය ප්‍රජා ශාලාව දැනට ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින බවත්, ප්‍රජා ශාලා යතුර ග්‍රාම නිලධාරී භාරයේ පවතින බවත් ප්‍රකාශ කර සිටියාය.
මෙහිදී නැවතත් ලක්රුවන් මන්ත්‍රීතුමන් විසින් ප්‍රාදේශීය ලේකම්තුමිය, මහ ඇමතිතුමන් ගේ අනුදැනුම ඇතිව 1997 වර්ෂයේදී ලිඛිතව එම ප්‍රජා ශාලාව අප වෙත පවරා ඇති බව ප්‍රකාශ කර සිටියේය. තවද, එම ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදී එහි නඩත්තු කටයුතු ප්‍රදේශීය සභාවට පැවරීමේ එකගතාවය මත එම ඉදිකිරීම් කටයුතු සිදු කල බවත්, එම අක්කර 2 ක් පමණ පවතින භූමියේ අප ප්‍රාදේශීය සභාවට තවත් ප්‍රයෝජන ලබා ගත හැකි බවත් ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ලිඛිතව පවරා දී ඇති එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය LRC එක මගින් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙසත් සභා අරමුදලින් මැනුම් කටයුතු කර ඇති බවත් එතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.
මෙහිදී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කර සිටියේ ඉඩමේ අයිතිය අප සතු නම් එම ප්‍රජා ශාලාව ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවෙන් අවසරයක් ගත යුතු බවයි. එසේ අවසරයක් ගෙන නොමැතිනම් එම භූමිය සහ ගොඩනැගිල්ල යන දෙකම ප්‍රාදේශීය සභාව සතු ලෙස සැලකිය හැකි බව එතුමා ප්‍රකාශ කර සිටියේය. මෙහිදී ඕනෑම කෙනෙකු යතුර ලබා ගත හැකි ලෙස යතුර තැබිය යුතු බවද එතුමා ප්‍රකාශ කලේය. උදාහරණයක් ලෙස සුදුවැලිපොත ප්‍රජාශාලාවේ LRC ඉඩමක පෞද්ගලික වියදමින් සාදන ලද ප්‍රජා ශාලාවේ යතුර ඕනෑම කෙනෙකුට භාවිතා කල හැකි ලෙස තබා තිබෙන බවත් එතුමා ප්‍රකාශ කලේය.
ඒ අනුව ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් මගින් අදාළ අයිතිය පවරා දීමේ කටයුතු සිදු කිරීමට නියමිත බැවින් ප්‍රජා ශාලාවේ නඩත්තු කටයුතු ප්‍රාදේශීය සභාව මගින් භාර ගැනීමට ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

11. 2019 වර්ෂයේ අයවැය සකස් කිරීම සදහා යෝජනා ලබා ගැනීම සම්බන්ධව 2018.05.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම ලිපියට අනුව 2019 වර්ෂයේ අයවැය වාර්තාවට ඇතුළත් කිරීම සදහා එම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හදුනාගත් සංවර්ධන ව්‍යාපෘති යෝජනා හා නව ආදායම් උත්පාදක යෝජනා 2018.06.30 දිනට පෙර ලබා දෙන ලෙස දන්වා සිටිමි.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම.**

**01. ඉවත් කරන ලද ඉන්ටර්ලොක් ගල් ලබා ගැනීම සම්බන්ධව තල්ගස්වල දියවර ගම්මාන බෞද්ධ මන්දිර එකමුතුව මගින් යොමු කරන ලද 2018.04.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

- ❖ මෙහිදී දියවරගම බෞද්ධ මන්දිර එකමුතුව අලංකාරවත් කිරීම සදහා එහි මිදුල සහ ඉදිරිපස මානය සකසා ගැනීම සදහා මාපලගම බස් නැවතුම් භූමියෙන් ගලවා ඉවත් කරන ලද ඉන්ටලොක් ගල් ලබා දෙන ලෙස එම ලිපිය මගින් දක්වා ඇත.
  මෙම ඉන්ටලොක් ගල් සම්බන්ධ ඉල්ලීම් ලිපි ගණනාවක් ලැබී ඇති බැවින් එම ඉන්ටර්ලොක් ගල් ලබා දෙන ක්‍රමවේදයක් සකස් කර ඉදිරියේදී එය ඉදිරිපත් කිරීමට තීරණය වූ අතර දැනට එම ගල් දීමට හැකියාවක් නොමැති බවද ප්‍රකාශ විය.

**02. වතුර බැසයන අක්‍රමවත් කාණු පද්ධතියක් සම්බන්ධව උඩුගම බාර්හංදියේ ගම්වැසි ජනතාව විසින් යොමු කරන ලද 2018.04.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

- ❖ උඩුගම, නාගොඩ බද්දේගම ප්‍රධාන මාර්ගයේ රාජ්‍ය ආයුර්වේද ගොඩනැගිල්ල අසල ඇති අක්‍රමවත් කාණු පද්ධතිය නිසා එම මාර්ගය කුඩා වර්ෂාවකදී පවා ජලයෙන් යට වන අතර එම දිනවලදී මගී ගමනාගමනය මෙන්ම වාහන ගමනාගමනයද අසීරු වන අතර පාසල් ළමුන්ට පවා මෙදිනට එම ස්ථානයෙන් ගමන් කල නොහැකි තත්වයක් ඇති බව එම ලිපිය මගින් දැණුම් දී ඇත. තවද, ජලය බැස නොයන තත්වයක් තුළ මදුරුවන් බෝවීම නිසා රෝග පැතිරීමේ අවධානමක්ද පවතින බව වැඩිදුරටත් සදහන් විය.

ඉහත කරුණ සම්බන්ධව බොහෝ මන්ත්‍රීවරුන් පක්ෂව කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙහිදී වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමන් විසින් ගම්වාසීන් සමග ඒකරාශී වී එම ලිපිය එවීමට කටයුතු කරන ලද පැවසූ අතර තම නිවසට හැරෙන එම ස්ථානයේ වැසි අවස්ථාවන්හිදී විශාළ ජලය ප්‍රමාණයක් රැස්වන අතර බද්දේගම් උඩුගම මාර්ගය ඉදිකිරීමත් සමග එම තත්වය තවත් වර්ධනය වී ඇති අතර එවන් අවස්ථාවන්හිදී පාසල් ළමුන්ට පවා ගමන් කිරීමට නොහැකි තත්වයක් පවතින බවද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය. මෙහිදී උඩුගම කොට්ඨාශයේ සිටින අනිත් මන්ත්‍රීවරුන් එම යෝජනාවට එකග වී ඒ සදහා කඩිනම් පිළිතුරක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

මෙහිදී අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමන් විසින් එම ප්‍රශ්ණය ඉතා පීඩාකාරී ලෙස ජනතාවට දැනෙන බවත්, සියළු දෙනාගේ දෝෂ දර්ශනයට ඒ ප්‍රශ්නය පවත්වන බවත් ප්‍රකාශ කර සිටි අතර මෙම ප්‍රශ්නය යොමු කල යුත්තේ මහා මාර්ග හා වාරි මාර්ග දෙපාර්තමේන්තුවට වන අතර දෙකම ඒකාබද්ධ වී ප්‍රශ්නය විසදිය යුතු බව ප්‍රකාශ කරන ලදී. කලින් තිබුනු පහත් බිම් ටික ගොඩකිරීම හේතුවෙන් වතුර බැස යාමට ස්ථාන නොමැතිකම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ප්‍රශ්නයක් වන බවත් ප්‍රකාශ විය. උඩ පැත්තේ හා යටි පැත්තේ යන දෙකේම නිවාස සෑදීම මෙයට තවත් හේතුවක් ලෙස දැක්වීය. මෙම බරපතල ප්‍රශ්නය සංවර්ධන කමිටු යෝජනා ලෙස ඉදිරිපත් කිරීමටත්, සභා සම්මත වූ යෝජනාවක් ලෙස මෙම කරුණ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා මහාමාර්ග දෙපාර්තමේන්තුවට යැවිය යුතු බවටත් එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. ඒ ආකාරයට තවත් තැන් කිහිපයක්ම පවතින බවත් එතුමා ප්‍රකාශ කරන ලදී. එනම් මුතුහෙට්ටිගම සර්විස් එක ගාව සහ කාබිල් හංදිය අසල පවතින පාසල ළග වතුර බැස නොයන ප්‍රශ්නයක් පවතින බැවින් එම ස්ථාන දෙකත් සමගම කලින් කතා කරන ලද ස්ථානයත් එකතු කර එම ස්ථාන තුනම සම්බන්ධ කරන ලෙස එතුමා පැවසීය. මේ සදහා විශේෂඥ දැනුම සහිත පුද්ගලයන් යෙදවීමද වැදගත් බව එතුමා පැවසීය. මෙහිදී තාක්ෂණික නිලධාරීන් මේ කාලය තුළ ස්ථානීය පරික්ෂාවකට යැවිය යුතු බවද වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමන් නැවත වරක් ප්‍රකාශ කරන ලදී. පායන කාලයකදී එහි ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් එහි නියම තත්වය නොපෙනෙන අතර මෙම කාලයේ ස්ථානීය

පරික්ෂණයක් සිදු කල යුතු බව පැවසු අතර අජිත් මහතා පැවසූ කරුණු සඳහා එතුමාගේ එකගතාව පළ විය.

මෙහිදී තරංග සුදර්ශන මන්ත්‍රීතුමාද එම ප්‍රදේශයේ පවතින එම තත්වය පිළිබඳව කලින් සභාවලදීත් ප්‍රකාශ කල බවත් ඒ සඳහා විසදුමක් නොලැබුනු බවත්, කුරුන්ද ප්‍රදේශයේ ඉඩම් ගොඩකිරීම හේතුවෙන් මෙලෙස වතුර බැස නොයන බව ප්‍රකාශ කරනු ලැබීය. අදාළ ආසන්න ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු සිදු කර තිබීමත් මාර්ගය අයින පමණක් පිරිසිදු කිරීමත් මෙයට හේතු වශයෙන් දැක්වීය. තවද ස්කේටරයක් යොදා දෙපාරක්, තුන්පාරක් සුද්ධ කර ඇති බවත් ඉදිරියේදී ස්කේටරයක් යොදා කාණු පද්ධතිය හොඳින් ශුද්ධ කිරීම තුළින් විසදුමකට යා හැකි බව එතුමා ප්‍රකාශ කළේය. ඒ සඳහා මුදල් වෙන් කර තිබුනද එම මුදල් වෙනත් ව්‍යාපෘති සඳහා යොදා ගත් බවද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය. කලින් එසේ සිදු නොවූ නිසා දැන් දරුනු ලෙස එම ප්‍රශ්නය පවතින බවත් ප්‍රකාශ කලේය.

සභාපතිතුමන් විසින්ද වැසි අවස්ථාවලදී එම ස්ථානය දුටු බවත් මෙතෙක් ඒ සඳහා විසදුමක් ලබා නොදීම පිළිබඳවද එතුමා විමතිය පළ කර සිටියේය.

මහජන පීඩා ඉවත් කිරීමේ වගකීම අපේ ප්‍රාදේශිය සභාව සතු වන බැවින් එය අනිවාර්යයෙන්ම ඉටු කර දිය යුතු බවද අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමන් ප්‍රකාශ කර සිටියේය.

උඩුගම බංගම පාරේ ගුණසේකර මහතාගේ නිවස අසල පවතින වතුර බැස නොයන ගැටළුවක් පිළිබඳව චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමන්ද මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටියේය. මෙම ස්ථානයේද ඉහත තත්වයම පවතින අතර වැසි අවස්ථාවන්හිදී එම ස්ථානයෙන් බයිසිකලයකටවත් ගමන් කල නොහැකි බව ප්‍රකාශ කරන ලදී. මේවායේ සැලසුම් සකස් කිරීමේදී නිලධාරීන් වැරදි අවස්ථාවක පැමිණ මෙම සැළසුම් සාදන ලද බවටද එතුමා සැකකරන බවද ප්‍රකාශ කර සිටියේය. වටපිටාවේ ජීවත් වන මිනිසුන්ට මේ සම්බන්ධව මනා අවබෝධයක් පවතින බවද එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙහිදී සභාපතිතුමන් ප්‍රකාශ කර සිටියේ බල ප්‍රදේශය තුළ එසේ වතුර නොබසින බොහෝ ස්ථාන ඇති බැවින් ඒ සියළුම ස්ථාන පිළිබඳ සොයා බලා කටයුතු කිරීමට එකග වන බවත්, උඩුගම බාර්හංදියේ ආයුර්වේදය අසල පවතින ස්ථානය පිළිබඳව මුලින්ම ක්‍රියා කල යුතු බවද ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අමර ධනංජය මන්ත්‍රීතුමාද ඉහත ප්‍රශ්නයට විසදුමක් ලෙස කුඹුර හරහා ඇලක් කැපීම සුදුසු බවද ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගයන්ති මන්ත්‍රීතුමියද ප්‍රකාශ කර සිටියේ දැනට තිබෙන ඇලවල් සියල්ලක් ගොඩවීමෙන් වතුර නොබසින බවයි. මෙහිදී ඇයගේ මූලිකත්වයෙන් පසුගියදා මොරගල්මුල්ල ඇල පිරිසිදු කිරීමට ශ්‍රමදාන කටයුත්තක් සිදු කල ඇය වැඩි දුරටත් ප්‍රකාශ කළාය.

අම්බලම්පිටි දොළ ගැලීමෙන් ඇති වන බංගම පාරේද වතුර ගලන තත්වය හේතුවෙන් අකුරුස්ස ප්‍රදේශයට යන ජනතාවට මහත් අවහිරතා ඇති වන බවත්, චන්ද්‍රසිරි මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල එකී කරුණු සම්බන්ධව අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමන්ද එකග වන බව ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම කොට්ඨාශවල පවතින එවන් බරපතල ප්‍රශ්න පිළිබඳව සභාවේ මන්ත්‍රීවරුන් යෝජනා හැටියට ඉදිරිපත් කල හොත් සභාව විදියට අපි ඒ ප්‍රශ්න ගැන අවදියෙන් සිටීමට හැකි වන බවද පැවසීය.

මෙහිදී ඉහත උඩුගම ප්‍රශ්ණය ඇතුළු කලින් කතා කළ ස්ථාන තුනම සභාව සම්මත වූ යෝජනා ලෙස සංවර්ධන කමිටුවට දැමිය යුතු බවද අජිත් මහතා ප්‍රකාශ කලේය.

මෙවැනි තත්වයන්ට හේතු වූ අවිධිමත් ගොඩකිරීම් සම්බන්ධව අනුමැතිය ලබා දුන්නේ කවුරුන්දැයි චන්ද්‍රා සහබන්දු මහතා මෙහිදී ප්‍රශ්න කර සිටියේය. ඒ සදහා සභාව වග කිව යුතු යැයිද කියා සිටියේය. විවිධ කාලවලදී පෞද්ගලික හිතවත්කම් හරහා අනුමැතිය නොගෙන සිදු කරන ලද ඉඩම් ගොඩකිරීම් වර්තමානයේදී මුළු උඩුගම කලාපයටම මහත් ගැටළුවක් වී ඇති බවද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබීය.

මෙහිදී අවිධිමත් ගොඩකිරීම් කොමසාරිස් පාලන කාලයේ සිටම පැවති බවත් වර්තමානයේදීත් එවන් කටයුතු පවතින බවත් අජිත් මහතා මෙහිදී ප්‍රකාශ කරනු ලැබිය.

ඉහත කරුණු සංවර්ධන කමිටුවට ඉදිරිපත් කිරීමට සභාපතිතුමන් විසින් එකග විය.

**03. මහජන නියෝජිතයන්ගේ ගෙවීම් සම්බන්ධ චක්‍රලේඛ ඇතුළත් කරමින් 2013/04/22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය සභාගත කරන ලදී.**

එම ගැසට් නිවේදනය අනුව මහජන නියෝජතයින් සදහා ගමන් වියදම් ගෙවීමේ රීති දක්වා තිබුණි. මෙහිදී සභාපතිතුමන්ට උප සභාපතිතුමන්ට හා අනෙකුත් මන්ත්‍රීතුමන්ලාට තම කාර්යයන් ස්වකීය වාහනයෙන් හෝ පොදු වාහනයෙන් ගමන් කිරීමේදී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණ කිරීමට මසකට රු. 3000.00 ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාව ගෙවනු ලැබිය හැකි බව දක්වා තිබුණි.

මෙහිදී යොදා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම් ලියාපදිංචි සහතිකයේ, වාර්ෂික ආදායම් බලපත්‍රයේ, වලංගු රක්ෂණ සහතිකයේ සහතික කල පිටපත් හා හිමිකරු විසින් මෝටර් රථය / ත්‍රීරෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිව්රුම් ප්‍රකාශය යන ලියවිලි ඉදිරිපත් කල විටෙක එකී වාහන තමන්ගේ ලෙස සළකා කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.

ගමන් වියදම් දීමනාව ලබා ගැනීමට ඉන්ධන බිල්පත් ඉදරිපත් කල යුතු අතර ගමන් වියදම් දීමනාව ගෙවීමට පෙර සභා අනුමැතිය ලබා ගත යුතු අතර වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සළසා තිබිය යුතු බවද දක්වා ඇත.

ඒ අනුව පෙර පරිදිම වාහනවල තොරතුරු ලබා දී චක්‍රලේඛයට අනුව බිල් ඉදිරිපත් කර ඉන්ධන දීමනාව ලබා දීමට ඒකමතිකව එකගතාව පළ වූ අතර එය ඒකමතිකව සභා සම්මත විය. එම දීමනාව 2018/04/04 වන සිටම ගෙවීමටත් රු. 1000.00 ක දුරකථන දීමනාව ගෙවීමටත් එකගතාවය පළ විය.

**04. නාගොඩ මාපලගම සංවර්ධන සභා උප කාර්යාලය සදහා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක පපාසකො/ගා/වි/03/3 හා 2018.05.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

මෙම පිටෝවිට වත්ත පාර සභාවෙන් ගොඩකර ඉදිකල පාරක් වන බවත් වර්තමානයේ මිනිසුන් නිවස සාදා ඇති බැවින් පාර පවතින්නේ කුඹුර මැදින් නිසා ඒ අවට කුඹුරු හිමියන්ගේ කැමැත්ත මත ඉඩම් පවරා ගැනීමේ කටයුත්ත අපට පවතින බව සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ඉඩම් අලුතින් පවරා ගැනීමට සභාවේ එකගතාවය පළ විය.

**07 යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ**

**01. පැතුම් හෝටලය, බාර් හංදිය, උඩුගම ලිපිනයේ පදිංචි ඒ. පී. සුනිල් මයා විසින් යොමු කරන ලද ඉල්ලීම් ලිපිය අනුව අනතුරුදායක මාර ගසක් කැපීම සම්බන්ධ සිදුවීම සඳහන් ලිපිය සභාගත කරන ලදී.**

දෙපාර්ශවයේම ආරවුල් සහගත තත්වයක් පවතින මෙම ඉඩමේ පවතින මාර්ගය පැමිණිලිකරුගේ නිවසේ සිට අඩි 49 පමණ දුරින් අඩි 100 ක පමණ උසකින් ඇළ ඉවුරේ පිහිටා ඇති බැවින් එම ගස අනතුරුදායක බැවින් ගස කපා ඉවත් කිරීම සුදුසු යැයි ස්ථානීය පරීක්ෂාවේදී වාර්තා කර ඇත.

දෙපාර්ශවයේම පවතින ඉහත ආරවුල් තත්වය පිළිබඳව ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කරනු ලැබීය

මෙහිදී ඉඩමේ අයිතිය පවතින්නේ පත්මසිරි කාරියවසම් මහත්මාට බවත්, කඩයේ බද්දට සිටින්නේ සුනිල් මහතා වන අතර ඒ දෙපල අතර බදු ප්‍රශ්නයක් මත නඩුවක් පවතින බවත් සභාපතිතුමන් ප්‍රකාශ කර සිටියේය. ඉවත් කිරීමට දෙපාර්ශවයෙන්ම බලය ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කර සිටියේය.

මෙහිදී අජිත් මහතා ප්‍රකාශ කර සිටියේ පනතට අනුකූලව කටයුතු කරන ලෙසත් එනම් නඩුවක් තිබෙන අවස්ථාවකදී වුවත් ගස කිසියම් පාර්ශවයකට අනතුරු ලෙස පිහිටා තිබෙන අවස්ථාවකදී ගස ඉවත්කිරීමේ සම්පූර්ණ බලය ප්‍රාදේශීය සභාවට පවතින බව එතුමා ප්‍රකාශ කරන ලදී. ඒ නිසා තිබෙන බලය අනුව ගස සත්‍ය වශයෙන්ම අනතුරුදායක නම් ඉවත් කරන ලෙස ප්‍රකාශ කර සිටියේය. මෙහිදී ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමන් ගස ඉවත් කිරීමට වැය වන පිරිවැය සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඒ සඳහා විශාල මුදලක් වැය වන බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගත යුතු බවද ප්‍රකාශ කරන ලදී. මෙහිදී සුනිල් කියන පුද්ගලයා මුලින්ම ගස කැපීමට ඉල්ලීම කිරීම තුළින් ඒ ගස ඔහුගේ නොවන බව පැහැදිලි වන බැවින් මෙහි වාසිය තමන්ට අත් පත් කර ගැනීම සඳහා කරන කටයුත්තක් බව තරංග සුදර්ශන මන්ත්‍රීතුමාන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගස කපා ඉවත් කර අපට ඒ සඳහා යන වියදම අඩු කර ඉතිරි මුදල ඔවුන්ට ලබා ගත හැකි ලෙස කටයුතු කිරීම පිළිබඳ චන්ද්‍රා සහබන්දු මන්ත්‍රීතුමන් විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගස කැපීමට අදාළ මුදල් අය කර ගැනීම පිළිබඳව නීති උපදෙස් ලබා ගත යුතු බවද ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

සභාපති බලතල අනුව කිසියම් පාර්ශවයකට අනතුරු ලෙස පිහිටා ඇත්නම් පමණක් ගස කපා ඉවත් කිරීමට සභාවේ එකගතාවය පළ විය.

**2. මාපලගම, අලුත් ඉහළ "මෙත්තා" ජ්‍යේෂ්ඨ පුරවැසි සංවිධානයට අනුබද්ධ බෝධි සත්කාරක කමිටුව මගින් ඉතා ආපදා තත්වයට පත්ව ඇති මහා බෝධි වෘක්ෂය කප්පාදු කර සංරක්ෂණය කිරීම , යන කරුණ යටතේ යොමු කරන ලද 2018.03.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව බෝධි වෘක්ෂය ඉතාම අනතුරුදායක තත්වයේ පවතින බැවින් එම වෘක්ෂය කප්පාදු කර සංරක්ෂණය කිරීමට වැයවන මූල්‍යමය ඇස්තමේන්තුවක් අප වෙත එවා තිබූ අතර සභාව සතු ප්‍රතිපාදන නොමැතිකම නිසා ඒ සඳහා ඉක්මන් ප්‍රතිචාරයක් ලබා දීමට අපොහොසත් විය.

මෙහිදී ගයාන් මධුෂංක මන්ත්‍රීතුමන් විසින් බෝගස කැපීමේදී සභාවේ ප්‍රතිපාදන නොමැති බැවින් එම කටයුත්ත කර ගැනීමට යම් පිරිසක් ඉදිරිපත්ව ඇති බැවින් සභාවේ වාහන සහ සේවකයන් පමණක් අවශ්‍ය බව පවසා සිටි අතර ඊට අවශ්‍ය ශ්‍රමිකයන් හා වාහන ලබාදීමට සභාවේ අනුමැතිය ලැබුනු අතර ඒ පිළිබඳ යෝජනාව සභා සම්මත විය.

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා ඃ**

**08.01. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා :-**

**08.01.I ආයතනය මගින් සිදු කිරීමට අවශ්‍ය හදිසි ගෙවීම් සඳහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සභාපතිතුමන් වියදම් දැරීම සඳහා බලය පවරා දීමේ ලිපිය සභා ගත කරන ලදී.**

මෙහිදී පෙර ලබා දී තිබූ රු. 5000.00 ක ආවරණ අනුමැති සීමාව රු. 10000.00 ක් දක්වා වැඩි කිරීමටත් ඒ අනුව ආවරණ අනුමැතිය යටතේ රු. 10000.00 කට යටත්ව හදිසි හා මාසික බිල්පත් ගෙවීම් කිරීම පිළිබඳ යෝජනාව නෙලී වක්වැල්ල මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කල අතර විජිත් සහබන්දු මන්ත්‍රීතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. මෙහිදී ආවරණ අනුමැතිය යටතේ මසකට සිදු කල යුතු ගණුදෙනුවල සීමාවක් නැති බවටද සභාව විසින් සම්මත කරන ලදී.

**08.01.II. ඔක්තෝම්බර් කියවීමේ මාසය මුල් කර ගෙන බල ප්‍රදේශයේ පුස්තකාල පාඨකයන් සහ සහ පාසල් දූ දරුවන්ගේ නිර්මාණශීලි හැකියාවන්ට අත දීමත් වශයෙන් පාසල් අතර සහ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල තුන අතර සාහිත්‍ය තරග පැවැත්වීමට රු. 100000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් සුදුසු යැයි අදහස් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**08.01.III. 2018 වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් මස දක්වා ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා සංග්‍රහ හා අනෙකුත් වියදම් වශයෙන් මසකට රු. 7800.00 බැගින් මාස 8 ක් සඳහා රු.62400.00 ක් වැය කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ සභා අරමුදලින් වියදම් දැරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් සුදුසු යැයි අදහස් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**08.01.IV. රක්ෂණ සහතික සහ ආදායම් බලපත්‍ර ලබා ගත යුතු වාහන සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

252-6478 දරණ කැබ්රථය , RD 1637 , RA 8569, RA 8570 හා RD 9457 දරණ ට්‍රැක්ටර් රථ SC 3570 හාඩ්මෙක් දොඹකරය, 340-4321 අත් ට්‍රැක්ටරය, RW 9115 හා RW 9116 යන බවුසර් RX 2239 සුදු යකඩ බවුසරය, RV 5013 ට්‍රැක්ටර් ට්‍රේලරය LL 7366 ට්‍රක් බවුසරය LL 7650 කෘෘ කැබ් රථය හා LL 7103 ටිපර් රථය සඳහා රක්ෂණ හා ආදායම් බලපත්‍ර ලබා ගත යුතු බව සඳහන් විය.

ඉහත සඳහන් යෝජනාව සඳහා විවිධ මන්ත්‍රීවරුන් තම අදහස් පකාශ කරන ලදී.

වාහනවල රක්ෂණ සහතික ලබා ගැනීමේදී වාහනයට යම් අනතුරක් සිදු වී ඇති විට ගෙවීම් සිදු කිරීම පිළිබඳව යම් තහවුරුවකට පැමිණිය යුතු බවත්, මීට පෙර අවස්ථාවන්හිදී අපේ JCB රථය අනතුරට ලක්වූ අවස්ථාවේදී අප හට අදාළ රක්ෂණ ආවරණය ලබා ගත නොහැකි වීම ඊට හේතු වශයෙන් අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේය.

තවද, වාහන රක්ෂණය කිරීමට අදාළ දින වකවානු තුලම අදාළ රක්ෂණ ආවරණය ලබා ගත යුතු බවත් එසේ සිදු නොකර ධාවනයේ යෙදෙන වාහන බොහොමයක් මෙහි පවතින බවත්, අමර විලේගේ මන්ත්‍රීතුමන් විසින්ද ප්‍රකාශ කරන ලදී. මෙහිදී අදාළ වාහන රක්ෂණය කල යුතු දිනට මාස තුනකට පෙරවත් එම රක්ෂණ ක්‍රියාවලිය නිලධාරීන් විසින් සිදු කළ යුතු බව එතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අදාළ වාහනවල රක්ෂණ කාලය අවසන් වන විට අනිවාර්යයෙන්ම රක්ෂණ ආවරණය ලබා ගත යුතු බැවින් සභාවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත්, අදාළ කාලයේදී එම කාර්යයන් ඉටු කිරීමට සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාව සම්මත විය.

**08.01.V. අළුත්වැඩියාවන් කල යුතු වාහන සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

PF 7360 කැබ් රථය, LL 7650 කෲ කැබ් රථය, LL 7103 ටිපර් රථය RA 8569 ට්‍රැක්ටර් රථය, RD 1637 ට්‍රැක්ටර් රථය , LL 7366 ට්‍රක් බවුසරය සහ RA 8570 ට්‍රැක්ටර් රථය යන වාහනවල විවිධ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට පවතින බව එම ලිපියේ සඳහන් විය.

එම අළුත්වැඩියා සිදු කිරීම් සම්බන්ධ කරුණට පක්ෂව හා විපක්ෂව විවිධ කරුණු ඉදිරිපත් විය.

වාහන සර්විස් කිරීමේදී මුල් අවුරුදු තුන යුනයිටඩ් මෝටර්ස් වෙතින් සර්විස් කල යුතු වන අතර මේ වන විට එම අවුරුදු තුනේ කාල සීමාව අවසන් බැවින් වාහන සර්විස් කිරීමට යුනයිටඩ් මෝටර්ස් වෙත නොයා වෙනත් ආසන්න ස්ථානයකට අදාළ වාහනය යොමු කිරීම පිළිබඳව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

සභාවේ පවතින වාහන පිළිබඳවත්, එම වාහනවල පවතින අඩුපාඩු පිළිබඳවත්, වාර්තාවක් සකස් කිරීම සඳහා මන්ත්‍රීවරු දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලෙසත්, එම කමිටු වාර්තාවට අනුව අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කළ යුතු බවත්, ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී. තවද පවතින සියළුම වාහන අළුත්වැඩියාවන් පිළිබඳව කර්මාන්ත කමිටුව මගින් වාර්තාවක් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස එතුමන් පැවසීය. මෙහිදී අළුත්වැඩියා කරන අවස්ථාවන්හිදී එම වාහනවල දුවන ලද කිලෝමීටර් ගණන්, ඔයිල් සීල් පිළිබඳවත්, අවසන් අළුත්වැඩියාව සිදුවුනු කාලය වැනි දේවල් පිළිබඳව වාර්තාවක් ලබා දී අදාළ අළුත්වැඩියාව පිළිබඳ තීරණය කර ගත යුතු බවටද එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. වාහන වල ටයර් මාරු කිරීමේදී එම ටයර් හොඳටම ගෙවෙන තෙක් නොසිට එම ටයර් rebill කර නැවත භාවිතා කිරීම තුළින් යම් මුදලක් ඉතිරි කර ගත හැකි බවත්, ඉදිරියේදී එසේ සිදු කිරීම පිළිබඳව සළකා බලන ලෙස අමර විලේගේ මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව කර්මාන්ත කමිටුව රැස්වී සභාවේ අළුත්වැඩියා කල යුතු වාහන පිළිබඳව වාර්තාවක් ඊළඟ සභාවාරයට ඉදිරිපත් කිරීමට එකගතාවය පළ විය.

**08.01.VI. නාගොඩ තැපැල් කාර්යාලයේ තැපැල් ස්ථානාධිපති විසින් තැපැල් ගාස්තු සම්බන්ධව අංක NF/83/2018 හා 2018.04.06 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂය සඳහා අදාළ නිදහස් තැපැල් ගාස්තු මුදල වන රු. 12000.00 ක මුදල අවසන් වී ඇති බැවින් ඉදිරි තැපැල් කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන කර ගැනීම සම්බන්ධව එම ලිපිය ඉදිරිපත් විය. දැනට එවන ලද මුළු තැපැල් ගාස්තු මුදලින් තැපැල් ගාස්තු නිදහස් සීමාව වන රු. 12000.00 අඩු කර ඉතිරි මුදල සභා අරමුදලින් දැරීමට සභාවේ එකගතාවය පළ විය.

**08.01.**Vii. කාර්යාලය තුළ සේවය කරන නිලධාරීන් සඳහා ලිපිගොනු කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහනක් පැවැත්වීමට රු. 50000.00 ක් මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා 2018.04.27 දිනැතිව ඉදිරිපත් කල ලිපිය සභාගත කරන ලදී.

එම ලිපියට අනුව කාර්ය මණ්ඩලය තුළ ඉහළ කාර්යසාධනයක් ලබා ගැනීමට වර්ෂයක් තුළ අවම වශයෙන් පුහුණු වැඩසටහන් දෙකක්වත් පැවැත්විය යුතු බව සඳහන් විය.

මෙම කරුණ සම්බන්ධයෙන් චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමන්, ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමන් සහ ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය විසින් වක්වැල්ල කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිලධාරීන් පුහුණුව සඳහා සම්බන්ධ වන බැවින් එම පුහුණු ලිපිය සම්බන්ධ තොරතුරු තවත් විස්තරාත්මකව ඉදිරිපත් කිරීම පිළිබඳව අදහස් දැක්වීය.

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ඉහත සඳහන් යෝජනාව ඉටු කිරීම වැදගත් වන බව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

**08.01.Viii. PF 7360 කැබ් රථයේ රියදුරු එම්. ඒ. වසන්ත මහතා විසින් PF 7360 දරණ කැබ්රථය සර්විස් කිරීම සම්බන්ධව 2018.04.20 දිනැතිව ඉදිරිපත් කල ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

කලින් සේවා සිදු කල යුනයිටඩ් මෝටර්ස් ආයතනය මගින් එම සේවාව ලබා නොගෙන මිළ ගණන් කැඳවා වෙනත් ස්ථානයකින් සේවා කිරීමට සභාව සාකච්ඡා කල අතර අදාළ සේවා කටයුත්ත ඉතා කඩිනමින් සිදු කළ යුතු බැවින් මෙවරද යුනයිටඩ් මෝටර්ස් ආයතනය වෙතින්ම සේවා කර ගැනීමට සභාවේ එකගතාවය පළ විය. ඉදිරියේදී සේවා කරන ස්ථානය පිළිබඳව නැවත තීරණය කරන බව ප්‍රකාශ විය.

**08.01.IX. PF 7360 කැබ් රථයේ රියදුරු එම්. ඒ. වසන්ත මහතා විසින් PF 7360 දරණ කැබ්රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධව 2018.05.01 දිනැතිව ඉදිරිපත් කල ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

සියළුම වාහන අළුත්වැඩියාවන් කර්මාන්ත කමිටුව වෙත යොමු කර වාර්තාවක් ඉදිරිපත් කර ඉන් අනතුරුව අදාළ අළුත්වැඩියාවන් සහ වාහන නඩත්තු කටයුතු සිදු කිරීමට සභාව එකගතාව පල කරන ලදී.

**08.01.X. LL 7650 දරන කෲ කැබ් රථයේ රියදුරු සම්පත් සංජීව මහතා LL 7650 දරණ කෲ කැබ් රථයේ ඉදිරිපස ටයර් මාරු කිරීම සම්බන්ධව 2018.03.06 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

මෙම වාහනයේ පෙර ටයර් මාරු කර ඇත්තේ 9107 Km වලින් වන අතර දැනට වාහනයේ මීටරය පවතින්නේ 18455 Km වේ. ඒ අනුව ඉදිරිපස ටයර් ධාවනය කර ඇත්තේ 9348 Km වේ.

මෙම කැබ් රථයේ ටයර් ධාවනය වී ඇත්තේ 9348 Km ක් වැනි අඩු ගණනක් වන අතර කැබ් රථයේ පවතින එලයිමන්ට් ගෙවීමේ ගැටළුව එවැනි තත්වයක් ඇති වීමට හේතු වී ඇත.

ඉදිරිපත් වූ එම යෝජනාව සම්බන්ධව මන්ත්‍රීවරු රැසක් පක්ෂව හා විපක්ෂව තම අදහස් ඉදිරිපත් කෙරුණි.

මෙහිදී ගරු මන්ත්‍රීවරුන් වන චන්ද්‍රා සහබන්දු මහතාත්, ධර්මසිරි ගනේවත්ත මහතාත්, පතිනායක මහතාත් 9348 Km ක් වැනි අඩු ගණනක් ධාවනය වී එම ටයර් මාරු කිරීම මහත් ගැටළුකාරී තත්වයක් බවත් එබැවින් කෲ කැබ් රථයේ එලයිමන්ට් පරීක්ෂා කර ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර වාර්තාව පරීක්ෂා කර බලා ටයර් මාරු කිරීමේ කටයුත්ත සිදු කරන ලෙස යෝජනාවට විපක්ෂව කරුණු දැක්වීය.

නමුත් ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මන්ත්‍රීතුමන් විසින් ලංකාව තුළ සියළුම සභාවලට ලබා දුන් කෲ කැබ් රථවල මෙම එලයිමන්ට්වල ගැටළු පවතින බවත්, මේ වාහන සභාව විසින් ඉල්ලුම් කර ලබා ගෙන නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ගෙවීම් කිරීමේ ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී. තවද, ගරු උප සභාපතිතුමන් විසින් ප්‍රකාශ කර සිටියේ වීථි පහන් සවි කිරීම සිදු කරන්නේ මෙම කෲ කැබ් රථය යොදා ගෙන බැවින් එම කටයුත්ත කඩිනමින් සිදු කළ යුතු බවත්, ඒ නිසා හැකි අයුරින් අදාළ නිවැරදි ක්‍රමය යොදා ගනිමින් මෙහි අළුත්වැඩියා කටයුත්ත සිදු කර ටයර් මාරු කිරීම සුදුසු යැයි යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

**08.01.XI. උඩුගම ගාල්ල ලිපිනයෙහි පදිංචි යූ. පී. උපනාම මහතා පදිංචි නිවසේ අළුත්වැඩියාව සඳහා දසමස් වැටුප් අත්තිකාරම් මුදල වන රු. 222700.00 ක මුදල ලබා ගැනීම සම්බන්ධව 2018.04.26 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් සුදුසු යැයි අදහස් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**08.01.XII. පුහුල්දූව, බද්දේගම ලිපිනයෙහි පදිංචි කේ. පී. ජයනි මහත්මිය පදිංචි නිවසේ අලුත්වැඩියාව සඳහා දසමස් වැටුප් අත්තිකාරම් මුදල වන රු. 226460.00 ක මුදල ලබා ගැනීම සම්බන්ධව 2018.04.25 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් සුදුසු යැයි අදහස් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**08.01.XIII. සභාවේ පවතින ලේඛනාගාරය සම්බන්ධව අංක ගා/නාප්‍රාස/ආ/-04 හා 2018. 05.04 දින ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

සභාවේ පවතින ලේඛනාගාරය, ස්ථානයක් නොමැතිකම නිසා දැනට පවත්වා ගෙන යනු ලබන්නේ ආයතනයේ ගබඩාවේ සහ භෝජනාගාර කාමර තුලයි. තවද ලේඛනාගාරය සඳහා භාවිතා කරනු ලබන කබඩ් ඉතා පැරණි බැවින් මීයන් වැනි සතුන්ගෙන් ඒවා ආරක්ෂා කර ගැනීම ගැටළුවක්ව පවතී.

තොරතුරු දැනගැනීමේ පනත අනුව ලේඛන අවුරුදු 12 ක් ආරක්ෂිතව පවත්වා ගත යුතු බැවින් ලේඛනාගාර නිලධාරියාට එම ලේඛනවල වගකීම ගත නොහැකි තත්වයක් පැන නැගී ඇත. එබැවින් ලේඛනාගාරය සඳහා සුදුසු ස්ථානයක් සහ ඊට අවශ්‍ය කබඩ් ලබා දෙන ලෙස ඉහත ලිපිය මගින් ඉල්ලීම් සිදු කර ඇත.

ඉහත කරුණ සම්බන්ධව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙතෙක් ලේඛනාගාර දත්ත පරිගණක ගත කර නොමැති බව මහත් අඩුපාඩුවක් ලෙස දක්වමින් එම දත්ත සියල්ල පරිගණක ගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස රංජිත් ජයවීර මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා අවශ්‍ය දැනුම සහිත තාක්ෂණික නිලධාරීන් සේවයට බඳවා ගෙන එකී කටයුතු කරන ලෙසද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ විය. එතුමා ඉදිරිපත් කල කරුණු සම්බන්ධව සභාවේ එකගතාවය පළ වුනි.

**08.01.XIV. නාගොඩ, මාපලගම හා උඩුගම මහජන පුස්තකාල තුන සඳහා ප්‍රාදේශීය කතෘගෙන් පොත් මිළදී ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිපි සභාගත කරන ලදී.**

එහිදී ඩබ්. ලීලාරත්න සිල්වා මහතාගේත්, ඩබ්. ඒ. වරුණ ප්‍රියංකර මහතාගේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව මගිනුත්, දිනිල් ඩී ලියනගේ මහතාත් පොත් මිළදී ගැනීමේ ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත.

ඒ අනුව

ගුරු සුවද පොත - රු. 250.00

අදෝනාව - රු. 690.00

තෙලාසන භවන - රු. 490.00

පළාත් පාලන සගරාව- රු. 400.00

- ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් සුදුසු යැයි අදහස් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**08.01.XV. නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමන්ගේ යෝජනා අනුව සකස් කරන ලද ඇස්තමේන්තු ලෙස පහත ඇස්තමේන්තු ඉදිරිපත් විය.**

**01. පරණතානායම්ගොඩ පඹගොඩ වතුරාව පාර සංවර්ධනය සඳහා රු. 1000000.00**

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා පඹගොඩවතුරාව පාරට වඩා සංවර්ධනය කල යුතු තවත් පාරවල් කොට්ඨාශය තුළ ඇති බැවින් ඉහත දක්වන ලද කරුණට , විපක්ෂව තම අදහස් දැක්වුවද දැනට ඒ සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති හෙයින් එම සංවර්ධන කටයුත්ත ඉටු කිරීමට ඉඩ දෙන ලෙස ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කර සිටි නිසා එතුමා එම යෝජනාව සඳහා එකගතාව පළ කර සිටියේය.

**02. හෝමදොල 65 මාර්ගය සංවර්ධනය කිරීම - රු. 2000000.00**

ඉහත මාර්ගයට වඩා ඉතා අබලන් සංවර්ධනය කල යුතු මාර්ග පවතින බව පවසමින් ඉහත කරුණට ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා තම විරුද්ධතාව පළ කර සිටියද පසුව එම මුදල් දැනට වෙන් වී අවසාන බැවින් එම විරෝධතාවය ඉවත් කර ගෙන එම යෝජනාවට එකගතාවය පළ කරන ලදී.

**03. උඩලමත්ත විලමාවත සිට ආරන්‍ය හරහා අකුලහේන මාර්ගය සංවර්ධනය - රු. 2000000.00**

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ යෝජනා කර සකස් කරන ලද ඇස්තමේන්තු ලෙස පහත ඇස්තමේන්තු ඉදිරිපත් විය.

**04. උඩුගම උක්ඹිවිට පෙර පාසලේ වැට අළුත්වැඩියාව - රු. 440000.00**

එම යෝජනාවට විපක්ෂව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම කරුණු ඉදිරිපත් කල අතර ඊට හේතුව එම ස්ථානයේ පවතින උක්ඹිවිට පෙර පාසල, පෙර පාසල වෙනුවෙන්ම ඉදි කර ඇති පුරනැගුම ශාලාවට ගෙන ගොස් දැනට පෙර පාසල පවතින ස්ථානයේ වෙළද සංකීර්ණයක් ඉදිකිරීමේ යෝජනාවක් එතුමා විසින් ඉදිරිපත් කිරීමයි.

එම නිසා එම යෝජනාව සංශෝධනය කිරීම පිළිබද සළකා බැලීමට තීරණය විය.

**05. මාපලගම වෙළද සංකීර්ණ අළුත්වැඩියාව - රු. 600000.00**
**06. උනන්විටිය සති පොළ සංවර්ධනය - රු. 700000.00**
**07. උනන්විටිය සති පොළ පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු. 270000.00**

අඩු ආදායම්ලාභී සභා සදහා ලබා දුන් ප්‍රතිපාදන යටතේ යෝජනා වී සකස් කරන ලද ඇස්තමේන්තු ලෙස පහත ඇස්තමේන්තුව ඉදිරිපත් කෙරුණි.

**08. උඩුගම පොළ සංවර්ධනය - රු. 7000000.00**

උපමාන පාදක ප්‍රතිපාදන යටතේ යෝජනා කර සකස් කරන ලද ඇස්තමේන්තු
**09. උඩුගම දකුණ ළමා ක්‍රීඩා පිටි සංවර්ධනය - රු. 600000.00**

උක්ඹිවිට පෙර පාසල් වැට අළුත්වැඩියා කිරීමේ යෝජනාව සංශෝධන සහිත වන අතර ඉදිරිපත් කරන ලද ඉතිරි 1 සිට 9 දක්වා සියළුම යෝජනා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**මන්ත්‍රී යෝජනා**

**08.02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා 2018.4.25 දිනැතිව ඉදිරිපත් කල යෝජනා ඇතුලත් ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව පහත යෝජනාවන් එතුමා ඇතුළත් කර තිබුණි.

8.2.I. කොළඹ කඩේ සිට කුඹුරුහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

8.2.II දියවර ගම්මානයේ මාර්ග දෙපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

8.2.III. ආදාහනාගාරයක් ඉදි කිරීම

ඉහත යෝජනා සියල්ලම ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනා සියල්ල පිළිබඳ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා අදහස් දක්වන ලදී.

අප බල ප්‍රදේශයට අයත් කුඹුරුහේන මාර්ගය එනම්, කොළඹකඩේ සිට කුඹුරුහේනට ඇති මාර්ගය ඉතාම අබලන් තත්වයක පවතින බවත්, එම මාර්ගය ගංවතුර උවදුරේදී විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කල හැකි බවත්, ඒ පිළිබඳව ගයාන් මන්ත්‍රීතුමා හා පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමන්ලාද දැනුවත් බව රංජිත් ජයවීර මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී. ඒ වගේම දියවර ගම්මානයේ ඇති කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම වැදගත් වන බවද ප්‍රකාශ කර සිටියේය. වැසි දිනවලදී පාසල් ළමුන්ට, වාහනවලට යාමට නොහැකි තත්වයක් මේ කාණු පද්ධතිය විධිමත්ව නොමැති කමින් වැසි ජලය පිරීම නිසා උද්ගත වී ඇති බව එතුමන් ප්‍රකාශ කළේය. එම තත්වයට කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

එමෙන්ම ආදාහනාගාරයක් සඳහා විවිධ ඉඩම් පැවතියත් මෙතෙක් එය ඉටු නොවුන අතර ආදාහනාගාරයක් සභාවට ඉදි කර ගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් විය.

**8.3. ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා 2018.04.02 දිනැතිව ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

8.3.I. හෝමදොල පුරනැගුම පොළ ජනතාවට විවෘත කිරීම

8.3.II. කැටගොඩ සිට උඩුගම බාර්හංදිය දක්වා කසල බදුන් තිබීම

8.3.III. උඩුගම ඩිපෝව අසළ ක්‍රීඩාංගනය සකස් කිරීම හෝ කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම

8.3.IV. උඩුගම බාර්හන්දියේ ත්‍රීරෝද රථ ගාලක් ස්ථාපනය කර වැසිකිලි පහසුකම් සැලසීම

8.3.V. ඇප්තොප්වත්ත කසළ කළමනාකරණය විධිමත් කිරීම හා පොල්වත්ත සංවර්ධනය කිරීම

8.3.VI. උඩුගම උප කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම හා ශ්‍රවනාගාරයේ නඩත්තු කටයුත විධිමත් කිරීම

ඉහත යෝජනා සියල්ලම ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

කැටගොඩ සිට උඩුගම බාර්හංදිය දක්වා වීථි පහන් සවි කිරීමේ යෝජනාවක්ද තරංග මන්ත්‍රීතුමා ඉදිරිපත් කල අතර එම යෝජනාවද ඉහත යෝජනාවන් සදහා එකතු කර ගන්නා ලෙසද ඉල්ලීමක් කලේය.

ඉහත යෝජනා සම්බන්ධව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් මෙසේ කරුණු දැක්වීය.

උඩුගම පොලේ වැසි දිනවලදී පවතින තත්වය එතුමන් පැහැදිලි කල අතර උඩුගම පොළ සංවර්ධනය සදහා ලක්ෂ 70 ක මුදලක් වෙන් කිරීම පිළිබදවද කෘතඥතාව පළ කරන ලදී. උඩුගම නගරය අලංකාරව තබා ගැනීම සදහා කසල බදුන් ලබා දීමටත්, උඩුගම ඩිපෝව අසළ ක්‍රිඩාංගණයක් ඉදි කිරීම හෝ උඩුගම ප්‍රදේශයේ ළමුන්ට රැකි රක්ෂා බිහි කර ගත හැකි ආකාරයට කර්මාන්ත ශාලාවක් බිහි කිරීම පිළිබදවත් එතුමා පැහැදලි කළේය.

තවද බාර්හංදියේ ත්‍රීරෝද රථ ගාලක් සෑදීම හා වැසිකිළි පද්ධතියක් සකස් කිරීම පිළිබදව අදහස් දක්වන ලදී. ඒ අනුව මොරගල්මුල්ල පාරේ ඇති ඉඩම් කොටස සංවර්ධනය කර ත්‍රීරෝද රථ ගාලට ලබා දෙන ලෙසද ඉල්ලා සිටියේය.

ඇප්තොප්වත්ත කසල කළමනාකරණය මධ්‍යස්ථානයේ බිහිවන පොහොරවල වටිනාකම පිළිබදව ජනතාව දැනුවත් කර එහි අලවිය පිළිබද විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම පිළිබදවත්, කලින් අප සතුව පැවති දැනට ප්‍රාදේශීය ලේකම්තුමිය යටතේ ඇති පොල් ඉඩම නැවත පවරා ගෙන එම පොල් ඉඩම සංවර්ධනය කිරීම පිළිබදවත් කරුණු දැක්වීය.

උප කාර්යාල පරිශ්‍රය පරික්ෂාවට යාමේදී උප කාර්යාල භූමිය පිරිසිදු කර නොමැති බවත්, ශ්‍රවනාගාරය ඉදි කිරීමේදී නියම ප්‍රමිතියට අනුව වේදිකාව සාදා නොමැති බවත් එහි තිර රෙදි දමා නොතිබීම පිළිබදවත් ප්‍රකාශ කරන ලදී. තවද වේදිකාව නිසි අයුරින් උස නොවීම, වැසිකිලි සදහා වතුර නොමැතිකම, සිටුවීමට කොඩි කණු නොමැති වීමද අඩුපාඩු වශයෙන් පෙන්වා දෙන ලදී. මෙහිදී අයකරනු ලබන මිළ ගණන් පිළිබදව අදහස් දැක්වූ අතර එහිදී නිවැරදි ක්‍රමවේදයක් යටතේ මිළ ගනන් ඉදිරිපත් කර සැමටම පොදු මිළක් නියම කිරීමට යෝජනා කල අතර ශ්‍රවනාගාරය පිළිබදව ජනතාවගේ දැනුවත් භාවය අඩු බවද සදහන් කලේය.

තවද පුස්තකාලය පිහිටි ගොඩනැගිල්ල අබලන් වී ඇති නිසා එය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසද ඉල්ලා සිටියේය. පෙර පාසල වෙනුවෙන් ඉදි කරන ලද පුරනැගුම ශාලාවට පෙර පාසල ගෙන ගොස් පුස්තකාල ගොඩනැගිල්ල සංවර්ධනය කර නැවත පුස්තකාලය උපකාර්යාල ගොඩනැගිල්ල තුලට ගෙන යන ලෙසත්, දැනට පෙර පාසල පවතින භූමිය වෙළද සංකීරණයක් ඉදි කිරීම පිණිස යොදා ගන්නා ලෙසත් එතුමා වැඩිදුරටත් තම යෝජනා තුළින් ප්‍රකාශ කරන ලදී. තවද කලින් උක්ඹිවිට පෙර පාසල් වැට ඉදිකිරීමේ යෝජනාව සංශෝධනය කර එම ස්ථානයේ වෙළද සංකීර්ණයක් ඉදිකිරීමට යොදවන ලෙස එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**8.4. ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය 2018.04.24 දිනැතිව ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

8.4.I. අප බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය විධිමත් කිරීම

8.4.II. අප ප්‍රාදේශීය සභා උපකාර්යාලවල සේවාවන් විධිමත් කිරීම

8.4.III. අප ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රිඩාපිටි හා ක්‍රීඩාගාර පවත්වා ගෙන යාම

එම යෝජනාවන් සියල්ලම ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනා පිළිබඳව ගරු මන්ත්‍රී අරුණා ශාන්ති මහත්මිය අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මන්ත්‍රීතුමිය විසින් කසළ කළමනාකරණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේදී කසල තේරීමේදී එම සේවකයන් මුහුණ පා ඇති ඉතා අසීරුදායක තත්වය පිළිබඳව අදහස් දැක්වූවාය. මෙහිදී කසල ලබා ගන්නා අවස්ථාවේදීම ඒවා වෙන් කර ලබා ගැනීම තුළින් එම ප්‍රශ්නය අවම කර ගත හැකි බවද ප්‍රකාශ කර සිටියේය. පොලිතීන්, විද්‍යුත් උපකරණ හා දිරාපත් වන දේ වෙන්ව ලබා ගැනීම තුළින් ගුණාත්මක පොහොර නිශ්පාදනයක් සිදු කල හැකි බවත්, පොලිතින් අලවි කර ආදායමක් ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. කසල වෙන් කර නොදෙන අවස්ථාවන්වලදී ඒවා ප්‍රතික්ෂේප කරමින් කසල එකතු කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් ඇති කල යුතුබවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද අප නිපදවන පොහොර නියම ප්‍රමිතිකරණයට ලක් කල යුතු බවත්, එම පොහොර භාවිතයෙන් එම ස්ථානයේ වගා කටයුතු සිදු කර ආදායමක් ලබා ගත හැකි ආකාරය පිළිබඳවද අදහස් ප්‍රකාශ කරන ලදී.

තවද අප මාපලගම උපකාර්යාලය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේදී එම පුස්තකාල ගොඩනැගිල්ල අසල පවතින අඹ ගස වහලට නැමීම හේතුවෙන් වහල කැඩී පුස්තකාලය හොඳටම තෙමී තිබුණ ආකාරයක් දක්නට වූ බවත්, ඒ නිසා එම අතු කපා වහල ශුද්ධ කර වහල සෑදීමට කටයුතු කරන ලෙසද ඉල්ලා සිටියාය. එමෙන්ම පුස්තකාල පරිශ්‍රය පාර්ටිෂන් කර දීමේ වැදගත්කමද ප්‍රකාශ කර සිටියාය. ඔවුන් කෑම ගැනීමට වෙනත් ස්ථානයකට යා යුතු බවත් එවිට පාඨකයන්ට පුස්තකාලය පරිශීලනය කිරීම අසීරු බවත් සඳහන් කළාය. අලුතින් පැමිණී නිලධාරිණියට පුටුවක් හා මේසයක් ද නොපැවැත්වුන අතර පුටු කිහිපයක් කැඩී තිබුන බවද ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පුස්තකාල පොත් අංක කර පවත්වා ගෙන යාම පිළිබඳව ඔවුනට පුහුණුවක් ලබා දෙන ලෙසද ඉල්ලා සිටියාය.

ක්‍රීඩාගාර සම්බන්ධයෙන්ද එතුමිය අදහස් ප්‍රකාශ කල අතර ඇතුමලේ ක්‍රීඩාංගණය ඇප්තොප්වත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයට සමාන බව පැවසීය. ක්‍රීඩාංගණය හරහා යන පාර නිසි පරිදි භාවිතා කිරීමටත්, ක්‍රීඩාංගනයේ පවතින ගේට්ටුව වසා තැබීමටත් කටයුතු කරන ලෙසත් තාප්පයේ පැලවී ඇති බෝ ගස එතැනින් ඉවත් කර එම ක්‍රීඩාංගනය අපට පවතින සම්පතක් ලෙස ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙසත් එතුමිය වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඉහත කරුණු වලට අමතරව මාපලගම උප කාර්යාල ගොඩනැගිල්ලෙහි ඇති ආයුර්වේද බෙහෙත් බෙහෙත් ශාලාවේ පවතින අඩුපාඩු පිළිබඳවද ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා අදහස් ප්‍රකාශ කලේය.

එනම්, වෛද්‍ය ශාලාව කැඩී ඇති බවත්, ප්‍රෙශර් මීටරය කැඩී ඇති බවත්, රෝගීන් බැලීමට ඇඳක්වත් නොමැති වීම හා රෝගීන් පරීක්ෂා කරන ස්ථානයේ අඩුම තරමින් තිර රෙදි යොදා ආවරණය කර නොමැති බවත් අඩුපාඩු වශයෙන් පෙන්වා දෙන ලදී. එමෙන්ම ආයුර්වේදයේ වැසිකිලි පද්ධතියද ඉතා අබලන් තත්වයේ පවතින බවත්, එම වැසිකිලියට වතුර නොමැතිකම විශාලම අඩුපාඩුවක් වශයෙන් පෙන්වා දෙන ලදී. කාර්යාලයක් ලෙස එම ස්ථානය විධිමත් ආකාරයෙන් සකස් වී නොමැති බවද සඳහන් කරන ලදී. ඒ වගේම මෙම ආයුර්වේදයේ 2015.03.25 දින සිට අනියම් පදනම මත සේවය කරනු ලබන මධුරි විජයන්ති මහත්මිය අවුරුදු තුනකට ආසන්න කාලයක් සේවයේ යෙදුනද මේ වන තෙක් ස්ථිර කිරීමට කටයුතු කර නොමැති බව ප්‍රකාශ කරන ලදී. ඇය විසින් ආයුර්වේදයේ පිරිසිදු කිරීමේ කටයුත්තේ සිට බෙහෙත් දීම, ලේඛන නඩත්තු කිරීම යනාදී සියළුම කාර්යයන් ඉටු කරන අතර ඇයගේ සේවය ඉතා අත්‍යාවශ්‍ය බවද සඳහන් කරන

ලදී. එබැවින් ඉහතින් සඳහන් කල සියළුම කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කර එම කරුණු සියල්ලම ඉටු කර දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ඉල්ලා සිටියේය.

මෙහිදී ගංවතුරින් විනාශ වූ උපකාර්යාලයක් ලෙස එහි යටිතල පහසුකම් සංවර්ධනය කර නොතිබීම මහත් අඩුපාඩුවක් බැවින් එම උප කාර්යාලයේ පවතින යටිතල පහසුකම් සපයා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතාද ප්‍රකාශ කරන ලදී.

**09. කාරක සභා වාර්තා**

**9.1ටෙන්ඩර් කමිටු වාර්තාව**

පසුගියදා ටෙන්ඩර් කරන ලද කඩය වෙනුවෙන් මීට පෙරත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබෙන අතර පෙර ඉදිරිපත් කරන ලද ලක්ෂ 34 ක පළමු ටෙන්ඩරය මුදල් නොගෙවීම නිසා අවලංගු වූ අතර දෙවන ටෙන්ඩර්පත කැඳවා ඇත. එම ටෙන්ඩරය සඳහාද මුදල් නොගෙවීම නිසා කාලය අවසන් වීමෙන් දෙවන ටෙන්ඩර්පතද අවලංගු කරන ලදී. එම ක්‍රියාවලිය අවලංගු කර නැවත අලුත් ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සභාව යොමු වී ඇති බව සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

**ඒ අනුව 2018.04.25 දින පැවැත්වූ ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

ඒ අනුව 2018.04.25 වන දින පෙ.ව. 11.00 ට නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් ඉල්ලුම්පත් විවෘත කරන ලද අතර ඒ සඳහා ටෙන්ඩර් මණ්ඩලය ලෙස ගරු සභාපතිතුමන්, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා, ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා සහභාගි විය. ඊට අමතරව ටෙන්ඩර් කමිටු නිලධාරි මණ්ඩලය ලෙස ලේකම්තුමිය , නිලංග පලිහවඩන මිය, දමිත් සිරිවර්ධන මයා, සමීර මල්ලවආරච්චි මයා, චන්දිමා සෙනවිරත්න මිය සහභාගි විය.

මෙහිදී ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර එදින රැස්වූ කමිටු නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමේදී 2018.03.19 දින වන විට සභාව ආරම්භ කර තිබූ නිසා ඔවුන් මෙම ටෙන්ඩර් කැඳවීම ගැන දැනුවත් කර නොතිබූ බැවින් එම අයදුම්පත්වලල අත්සන් යෙදීම ප්‍රතික්ෂේප කරන බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී.

එසේ වුවද, නැවතත් සභාව සංස්ථාපනය වූයේ 2018.03.20 දින බවත්, ඊට පෙර ටෙන්ඩර් කමිටු මණ්ඩලය රැස්වී 2018.03.20 දින වන විට පුවත්පත් දැන්වීම යොමු කර තිබූ බවත්, 2018.03.20 දින එම ටෙන්ඩර් දැන්වීම "දිවයින" පුවත්පතේ පළ කළ බවත්, ලේකම්තුමිය විසින් දන්වා සිටින ලදී.

එසේම ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් කඩ කාමරය දීර්ඝ කාලීන ව බදු පදනම මත ලබා දීම නොව වාර්ෂික ටෙන්ඩර් කැඳවීම සිදු කළ යුතු බව ප්‍රකාශ කරමින් අදාළ ටෙන්ඩර් කැඳවීම සම්බන්ධව අත්සන් තැබීම ප්‍රතික්ෂේප කරන ලදී.

එම කඩ කාමරය දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරණ චක්‍රලේඛය අනුව දිගුකාලීන බදු පදනම මත ටෙන්ඩර් කර ඇති බව ලේකම්තුමිය විසින් පැහැදිලි කරන ලදී.

ටෙන්ඩර් කමිටුව සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමන්, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා, ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා කඩ කාමරය ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් විරෝධතා ප්‍රකාශ නොකරන ලද අතර, ඒ සඳහා එකඟ වී අත්සන් තබන ලදී. මෙහිදී මේ සඳහා වැඩිම ලංසුව වන රු. 2065625.00 ක මුදල ඉදිරිපත් කල පී. පී. සඳුන් චතුරංග මයාට එම කඩ කාමරය ලබා දීමට තීරණය කරන ලද බව ටෙන්ඩර් කමිටු වාර්තාව මගින් ඉදිරිපත් කර තිබුණි.

සභාවේ ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාපලගම උප කාර්යාල පරිශ්‍රයේවත් අදාළ ටෙන්ඩර් දැන්වීම පළ කර නොමැති බවත්, එම කඩය ටෙන්ඩර් කිරීම සම්බන්ධව ප්‍රජාව කිසිදු දැනුවත්භාවයක් නොමැති බවත්, සභාවේ සිටින මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු පමණක් හැර අනිත් අය මේ සම්බන්ධව දැනුවත් වී නොමැති බවද ප්‍රකාශ කරමින් මෙම ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට විරුද්ධ වන බව පවසමින් ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී. අඩුම තරමින් ටෙන්ඩර් මණ්ඩලයේ ගරු මන්ත්‍රීවරුන්ද මේ පිළිබඳ දැනුවත් නොමැති බවත්, අවු 99 කට බදු දී ඇති මේ කඩ කාමරය මගින් සභාවට ඉතා විශාල ආදායමක් ලබා ගත හැකි බවද ප්‍රකාශ කරමින් ටෙන්ඩර් පටිපාටියට විපක්ෂව එතුමන් තම අදහස් ඉදිරිපත් කරන ලදී.

මෙහිදී මාධ්‍ය දෙකකින් ටෙන්ඩර් පටිපාටිය පිළිබඳව ජනතාව දැනුවත් කර සිදු කරන ලද මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය නිවැරදි බව පවසමින් ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා ඊට පක්ෂව අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ගේ දැනුවත්භාවය අඩු බව පිළිගන්නා අතර ටෙන්ඩර් පටිපාටිය නිවැරදිව සිදු වූ බවත් මෙහි කිසිදු වංචාවක් සිදු නොවුන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා මෙයට පක්ෂව කරුණු ඉදිරිපත් කරන ලදී. එනම්, ලේකම්තුමිය කොමසරිස් බලතල අනුව මෙහි පළමු ටෙන්ඩරය ලක්ෂ 34 කට කැඳවා ඇති බවත් එය අවලංගු වූ නිසා ඊළඟ ටෙන්ඩරයට ගොස් ඇතත්, එයත් අවලංගු වූ නිසා නැවත කෙමසාරිස්තුමාගේ ඉල්ලීම මත අලුත් ටෙන්ඩර් පටිපාටියකට යාමට ගත් තීරණය නිවැරදි බවත් සභාව මගින් එය ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීම පළ කිරීම තුළින් ජනතාව දැනුවත් වන බවත්, එහෙයින් එම ක්‍රියාවලිය නිවැරදි බවත් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම ටෙන්ඩරය විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයේ සිටි බවත් මනා විනිවිදභාවයකින් සිදු වූ බවත් මෙය පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කල බවත්, ප්‍රකාශ කලේය. එතුමා මෙහිදී කුඩා අඩුපාඩු පැවතියද, ලේකම්තුමිය විසින් කොමසාරිස් බලතල අනුව විනිවිදතාවයකින් කරන ලද මෙම ටෙන්ඩරය පිළිගත හැකි ටෙන්ඩරයක් ලෙස වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද අතර ටෙන්ඩරය දීම සුදුසු බව යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත කරුණාට විපක්ෂව අදහස් දක්වමින් ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් ප්‍රකාශ කර සිටියේ, නිවැරදි ක්‍රමවේදය තුළ ටෙන්ඩර් පටිපාටිය සිදු වී ඇති බවත්, 2018/3/20 දින දින ගැසට් කරන ලද මෙම ටෙන්ඩරය සම්බන්ධව මෙහි සිටින සියළුම මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ යුතුකමක් පවතින බවත්, පවසමින් කරුණු ප්‍රකාශ කලේය. මින් පසු මෙවැනි ටෙන්ඩර් කටයුත්තකදී ටෙන්ඩර් මණ්ඩලය රැස්වී තීරණයකට එළඹිය යුතු බවත් ප්‍රකාශ කළේය. මෙවැනි ප්‍රධාන නගරයක පවතින කඩකාමර යක් තුළින් ඊට වඩා වැඩි ආදායමක් ලබා ගත හැකි බවද ප්‍රකාශ කළේය.

තවද ටෙන්ඩර් පටිපාටියට විපක්ෂව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ද තම අදහස් ප්‍රකාශ කරන ලදී. වෙනදා ලිඛිතව මන්ත්‍රීවරුන් හට දැනුම් දුන්නද, මෙවර දුරකථන ඇමතුම් මගින් පමණක් දැනුවත් කරන ලද බව ප්‍රකාශ කලේය. සාමාන්‍ය කර්මාන්තයක් ටෙන්ඩර් කිරීම වන බව සළකා තමාද මෙහි පැමිණි බවත්, ප්‍රකාශ කරන ලදී. පෙර කාලයේදී තල්ගස්වල පොල ටෙන්ඩර්

කිරීමේදී ඇති වූ තත්වයක් සිහිපත් කල එතුමා කියා සිටියේ එලෙස මුලින් ටෙන්ඩර් ඉදිරිපත් කල අවස්ථාවේ ලක්ෂ 33 කට මිළදී ගැනීමට එකග වූ පුද්ගලයාම පසුව එය ගෙවීම පැහැර හැර දෙවැනි ටෙන්ඩරය මගින් එම පුද්ගලයාම ලක්ෂ 20 කට ටෙන්ඩරය ලබා ගැනීමට ඉදිරිපත් වී ඇත්දැයි ඇති වූ සැකය මත එම ටෙන්ඩර් ක්‍රියාවලියට විරෝධතාව ප්‍රකාශ කල බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. තවද මෙය දිර්ඝකාලීන බදු පදනම මත ලබා නොදී වාර්ෂික බද්ධකට යටත්ව ලබා දීම සුදුසු ලෙස සැළකීම නිසාද එතුමා ඊට විරෝධතාව ප්‍රකාශ කරන ලදී. මෙහිදී අපෙන් මිළදී ගෙන ඔහු වෙනත් කෙනෙකුට මාස්පතා බදු අය කර ගෙන නැවත කුලීයට දීම සිදු කරන බැවින් එය අපට මහත් අවාසිදායක තත්වයක් වන නිසා වාර්ෂික බදු පදනම මත දීමට එතුමා කැමති බව ප්‍රකාශ කළේය. මේ මුදල් සෘජුවම අපට නොලැබෙන අතර ඔහු විසින් එම මුදල් උපයා ගැනීම සිදු කරන බැවින් අපට එය අවාසි සහගත නිසා එම ටෙන්ඩර් පටිපාටියට එතුමන් තම විරෝධතාවය ප්‍රකාශ කරන ලදී.

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා (මාසික ආදායම් හා වියදම් වාර්තා)

### 10.1 2018 අප්‍රේල් මාසයේ ගෙවීම් පිළිබඳ වාර්තාව

**<u>ඉදිරි ගෙවීම්</u>**

**01. මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම**

**2018 අප්‍රේල් මස විදුලි බිල්පත**

| | | | |
|---|---|---|---|
| I. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු 331.56 |
| II. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1155.00 |
| III. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු 240.00 |
| IV. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 4869.90 |
| V. | 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 313.20 |
| VI. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 331.50 |
| VII. | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 294.90 |
| VIII. | 8617046104 | -බහුකාර්ය මධ්‍යස්ථානය | - රු 1008.60 |
| IX. | 4592323912 | - යමුනා ස්ටෝර්ස් | - රු. 240.00 |
| X. | 2810236100 | - මා.ක. ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| XI. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු 240.00 |
| XII. | 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |
| XIII. | 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 514.50 |
| XIV. | 4501090200 | - මා.වෙ.සංකීර්ණ කොරිඩෝව | - රු.2051.70 |
| XV. | 2809093105 | - කොමපෝස්ට් ව්‍යාපෘතිය | - රු 1612.50 |

**2018 මාර්තු මස විදුලි බිල්පත**

| | | | |
|---|---|---|---|
| I. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු 240.00 |
| II. | 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |
| III. | 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| IV. | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 258.30 |

| | | | |
|---|---|---|---|
| V. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 935.40 |
| VI. | 2809093105 | - කොමපෝස්ට් ව්‍යාපෘතිය | - රු 1447.80 |
| VII. | 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු 258.30 |
| VIII. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු 258.30 |
| IX. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු 240.00 |
| X. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු 1264.80 |
| XI. | 4501090200 | - මා.වෙ.සංකීර්ණ කොරිඩෝව | - රු.2015.10 |
| XII. | 4592323912 | - යමුනා ස්ටෝර්ස් | - රු. 240.00 |
| XIII. | 2810236100 | - මා.ක. ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| XIV. | 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 551.10 |
| XV. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු 276.60 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

**මාර්තු මස දුරකතන බිල්පත් ගෙවීම්**

| | |
|---|---|
| 1. 0912296433- ප්‍රධාන කාර්යාලය | - රු 5488.63 |
| 11. 0912296537- ප්‍රධාන කාර්යාලය | - රු 8269.85 |
| 111. 0912296577- මාපලගම උප කාර්යාලය | - රු 753.53 |

**03. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය.**

ජල බිල්පත් ගෙවීම- උඩුගම උප කාර්යාලය-33/53/003/008/11
(2018.03.17-2018.04.19) - රු 5200.30

**04 සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**2018 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 320 ක | - රු.30400.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 200 ක | - රු. 19000.00 |
| LL 7650 කෘෘ කැබ් | ඩීසල් ලීටර් 133 ක | - රු. 12635.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 43 ක | - රු. 4085.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 85 ක | - රු 16150.00 |
| ධූමායන - | ඩීසල් 20 | - රු 1900.00 |
| | පෙට්‍රල් 08 | - රු 936.00 |

**සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**2018 මාර්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 310 ක | - රු.29450.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 200 ක | - රු. 19000.00 |
| LL 7650 කෘෘ කැබ් | ඩීසල් ලීටර් 50 ක | - රු. 4750.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 42 ක | - රු. 3990.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 140 ක | - රු 13300.00 |
| RD 9457 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 39 ක | - රු. 3705.00 |

**05. නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම**

I. එම් එච්. ෆර්සියා ෆර්වින් මිය - 2018.04.07/21 - රු. 3535.60
II. ඩී. ටී. සිරිවර්ධන මයා - 2018.04.21 - රු. 1282.15

**06. ලේකම් , නාගොඩ ප්‍රාදේශීය සභාව.**
2018.03.22 දින පාර්ලිමේන්තුවේ පැවති පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වීම සඳහා අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 800.00

**07. ගමන් වියදම් ගෙවීම්**
**2018 මාර්තු**

I. එම්. එච්. ෆර්සියා ෆර්වින් මිය - රු. 750.00
II. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 259.00
III. බී. ඩී. රුවනි චතුරිකා මෙය - රු. 1000.00
IV. යූ. වී මධුර ප්‍රභාත් මයා - රු. 2520.00
V. බී. ඩී. එල්. ඩී. කුමාරි මිය - රු. 1004.00
VI. කේ. කේ. අවන්ත මයා - රු. 1008.00
VII. දිලිනි දිසානායක මිය - රු. 2830.00
VIII. ඩී. ටී. සිරිවර්ධන මයා - රු. 2469.00
IX. ජී. පී. පී. ශ්‍රීණිකා මෙය - රු. 287.00
X. එස්. කේ. මල්ලවආරච්චි මයා - රු. 574.00
XI. ඉෂානි දීපිකා ගනේවත්ත මිය - රු. 1008.00
XII. එම්. ඒ. වසන්ත මයා - රු. 1225.00
XIII. එච්.එම්.හේවාවිතාන මෙය - රු. 175.00

**ගමන් වියදම් ගෙවීම්**
**2018 අප්‍රේල්**

I. එම්. එච්. ෆර්සියා ෆර්වින් මිය - රු. 1090.00
II. ඉරේෂා මදනායක මිය - රු. 490.00
III. බී. ඩී. රුවිනි චතුරිකා මෙය - රු. 1500.00
IV. චන්දිමා සෙනවිරත්න මිය - රු. 1004.00
V. ශ්‍රියානි කිරින්දගේ මිය - රු. 520.00
VI. එස්. කේ. මල්ලවආරච්චි මයා - රු. 909.00
VII. කේ. කේ. අවන්ත මයා - රු. 504.00
VIII. ඒ. එස්. එම්. විමලලතා - රු. 522.00

**08. පරිවර්ථීත ගමන් වියදම් 2018 පෙබරවාරි**
I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 3000.00

**පරිවර්ථීත ගමන් වියදම් 2018 මාර්තු**
I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 3000.00
II. අයි. චතුරි චින්තිකා මිය - රු. 2911.00
III. කේ. ජී. ජයනි මිය - රු. 3000.00
IV. ඩී. ටී. සිරිවර්ධන මයා - රු. 4000.00
V. දිලිනි දිසානායක මිය - රු. 3450.00

**පරිවර්ථීත ගමන් වියදම් 2018 අප්‍රේල්**

| | | |
|---|---|---|
| I. | ඩී. එන්. ඩී. පලිහවඩන මිය | - රු. 3000.00 |
| II. | අයි. චතුරි චින්තිකා මිය | - රු. 2483.00 |
| III. | කේ. පී. ජයනි මිය | - රු. 2904.00 |
| IV. | ඩී. ටී. සිරිවර්ධන මයා | - රු. 4000.00 |
| V. | දිලිනි දිසානායක මිය | - රු. 4000.00 |

**09. අතිකාල දීමනා ගෙවීම්**
**2018 මාර්තු**

| | | |
|---|---|---|
| I. | එම් ඒ. වසන්ත මයා | - රු. 5715.45 |
| II. | එච්. එම්. හේවාවිතාන මෙය | - රු. 2988.90 |
| III. | කේ. කේ. අවන්ත පද්ම මයා | - රු. 463.65 |
| IV. | යසරත්න විජේසේකර මයා | - රු. 2574.00 |

**2018 අප්‍රේල්**

| | | |
|---|---|---|
| I. | කේ. කේ. අවන්ත පද්ම මයා | - රු. 1180.20 |
| II. | එච්. එම්. හේවාවිතාන මෙය | - රු. 1145.74 |
| III. | එම්.ඒ.ඩී.චන්ද්‍රප්‍රභා මෙය | - රු. 1145.74 |
| IV. | පී.පී.පී.ශ්‍රීනිකා මෙය | - රු. 1134.36 |
| V. | යසරත්න විජේසේකර මයා | - රු. 6435.00 |
| VI. | ඉෂානි දීපිකා ගනේවත්ත මිය | - රු. 478.50 |
| VII. | ඩබ්. ඒ. සී. මධුෂානි මිය | - රු. 1138.05 |
| VIII. | චතුරානි පතිනායක මිය | - රු. 997.85 |

10. එච්. ඩබ්. පී. අමරනාත් මයා, ම.සෞ.ප.
ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.03.02) - රු. 354.00
ආහාර පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.03.22) - රු. 342.00

11. යු. කේ. ජයන්ත මයා, ම.සෞ.ප.
ආහාර සාම්පල් ලබා දීම සඳහා කළුතර සෞඛ්‍ය විද්‍යායාතනයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.03.29) - රු. 500.00

12. පී. ඒ. අමාලි ප්‍රදීපිකා මිය, සංවර්ධන නිලධාරී
භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවට පැමිණීමේ ගමන් වියදම් ගෙවීම් - රු. 2410.00

13. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී
MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයේ ටෝනර් කාට්ලේජය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 7465.00

14. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල

I. ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස කොටසේ තීන්ත ආලේප කිරීමේ බිල්පත පියවීම (බි.අ.ග 504) - රු. 10911.00

II. ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස කොටසේ තීන්ත ආලේප කිරීමේ බිල්පත පියවීම (බි.අ.ග 3409) - රු. 1736.00

15. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිග වීගණන ගාස්තු මුදලින් කොටසක් ගෙවීම - රු. 10000.00

16. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,

I. 2018.01.01 - 2018.03.31 දක්වා කාර්තුවට අය කර ගත් මුද්දර බදු මුදල් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම - රු. 4700.00

II. හිග එකතු කල අගය මත බදු මුදල කොටස් වශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම - රු.12000.00

17. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල

I. නඩු අංක L 13814 දරණ නඩුව වෙනුවෙන් පෙනී සිටීමේ හා නඩු වාර්තාවේ ඡායා පිටපත් ගාස්තු ගෙවීම - රු. 4000.00

II. නඩු අංක P 15977 දරණ නඩුව වෙනුවෙන් පෙනී සිටීමේ හා ලිඛිත දේශන සකස් කිරීමේ ගාස්තු ගෙවීම - රු. 8000.00

III. නඩු අංක L 16242 දරණ නඩුව වෙනුවෙන් පෙනී සිටීමේ ගාස්තු ගෙවීම - රු. 3000.00

18. එච් එල් කේ ශ්‍රීනිත් රුක්ෂාන් උඩුගම

උඩුගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 මාර්තු - රු 4520.00

19. බී. ජේ. කරුණාරත්න, මාපලගම
මාපලගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 පෙබරවාරි - රු.3760.00
2018 මාර්තු - රු 4430.00

20. එම්. ඒ. සිරිපාල මාපලගම
මාපලගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 පෙබරවාරි - රු.3040.00
2018 මාර්තු - රු 3340.00

21. ඒ. ඩී. කරුණාරත්න යටලමත්ත
නාගොඩ මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 පෙබරවාරි - රු.5440.00
2018 මාර්තු - රු 6100.00

22. අයි ඇන්ඩ් ආර් ටෙලි කමියුනිකේශන් සොලියුෂන්ස්, තලවතුගොඩ
නවක මන්ත්‍රීවරුන් සඳහා අවශ්‍ය ඩෙලිගේට් යුනිට් 13 ක් අලුතින් මිළදී ගැනීමේ බිල්පත පියවීම
- රු.267500.00

23. මාපලගම පැරණි කඩ කාමර 1 වෙනුවෙන් කල ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවීම

I. කේ. කේ. පී ප්‍රේමදාස මයා - රු. 5000.00
II. චලනි මාසාච්චි මිය - රු. 5000.00
III. පී. පී. සදුන් චතුරංග මයා - රු. 5000.00
IV. පී. පී. කසුන් සාරාංග ඔයා - රු. 5000.00

24. සිතිජ සුහසාධක සංගමය, ගාල්ල
2018.04.12 දින පවත්වන ලද සංගීත ප්‍රසංගයේ ඉතිරි වූ ප්‍රවේශපත් වෙනුවෙන්
තැන්පත් මුදල් නිදහස් කිරීම - රු. 8180.00

25. පී. එල්. රංජන් මයා, ගාල්ල
මහජන නියෝජිතයන් සඳහා මේසය මත තබන ප්ලාස්ටික් නාම පුවරු
මිළදී ගැනීමේ බිල්පත් - රු. 10800.00

26.උපාලි නිවුස් පේපරස් පුද්.සමාගම, කොළඹ 13.
නාගොඩ ප්‍රාදේශීය සභාව සතු මාපලගම පැරණි කඩ කාමර අංක 01 බදු දීම සඳහා
ටෙන්ඩර් කැඳවීමට අදාළ දැන්වීම් පළ කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම - රු 18112.50

27. ෆින්ටෙක් මැනේජ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ
Sharp ඡායා පිටපත් යන්ත්‍රයේ ටෝනර් කාට්‍රිජ් බිල්පත පියවීම - රු. 12750.00

28. ජේ. පී. කමියුනිකේශන්, නාගොඩ
ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රීය වීම හේතුවෙන් සභා වාර්තාව ඡායා පිටපත් කිරීමේ
වියදම - රු. 1296.00

29. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, නාගොඩ
2018.04.04 දින පවත්වන ලද මංගල සභා වාරයේදී ආහාරපාන සඳහා දරණ ලද
වියදම් සඳහා ගෙවීම් - රු. 15400.00

**රජයේ ආධාර**

30. උඩුගම උතුර ග්‍රාම සංවර්ධන සමිතිය

උඩුගම බස්නැවතුම්පොලෙහි උඩුමහලේ කඩකාමර සඳහා වැසිකිලියක්
ඉදි කිරීමේ කර්මාන්තය (I අදියර ගෙවීම්) - රු.285375.81

උඩුගම බස්නැවතුම්පොලෙහි උඩුමහලේ කඩකාමර සඳහා වැසිකිලියක්
ඉදි කිරීමේ කර්මාන්තය (II අදියර ගෙවීම්) - රු.164805.30

උඩුගම උප කාර්යාලයේ රු. 5200.00 ක ජල බිල සම්බන්ධව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විමසා සිටි අතර වතුර බවුසර් පිරවීම සිදු කරනු ලබන්නේ උඩුගම උප කාර්යාලයෙන් බැවින් රු. 5200.00 ක බිලක් පැමිණ ඇති බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ගෙවීම් වාර්තාවේ පවතින ගමන් වියදම් පිළිබඳව විස්තර කරන ලෙස ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කරන ලද අතර ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් වශයෙන් නිලධාරීන් පුහුණුවලට යන ගමන් වියදම් පරිවර්ථිත ගමන් වියදම් ලෙස ක්ෂේත්‍ර නිලධාරීන්ට කරන ගෙවීම් හා රියදුරු හා මුරකරු ගෙවීම් ලෙස අතිකාල දීමනා දක්වා ඇති බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

මුදල් ගෙවීම සම්බන්ධව ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.

## 11. වෙනත් කරුණු :-

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී ගයාන් මධුශංක මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. වෙරංග මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට අපේ චන්දිමා දිල්රුක්ෂි මන්ත්‍රීතුමිය හා නිශාන්ත නන්දන මන්ත්‍රීතුමන් දන්නා පරිදි ජයතිස්ස අබේසුන්දර මහතාගේ නිවස අසළින් වැසි දිනවලදී ගමන් කිරීමට නොහැකි තත්වයක් පවතිනවා. ඉතා පොඩි වර්ෂා තත්වයකටත් එම ස්ථානයෙන් ගමන් කිරීම ඉතා අසීරු තත්වයක පවතිනවා. පාසල් ළමුන් මෙම ස්ථානයෙන් ගමන් කරන විට ඉතා දැඩි අපහසුතාවයකට පත්වෙනවා. සභාව විසින් ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය පිළිබද දැනගන්න කැමති යැයි ප්‍රකාශ කරමින් එතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් විය.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මාගේ ග්‍රාම සේවා වසම වන 212 කැප්පිටියාගොඩ වසම තුළ පවතින පාරවල් එකක්වත් යන්න බැහැ. ප්‍රධාන පාරවල් ඇතුලට ගිය විට ඇති සියලුම පාරවල් මැටි සහිත පාරවල්. මේ දිනවල වැසිබර තත්වයක් පවතින නිසා පාරවල් සෝදා යාමට ලක්වීමෙන් කිසිම පාරක ගමන් කිරීමට හැකි තත්වයක් නැහැ. පසුගිය කාල පරාසය තුළම මේ පිළිබදව කිසිදු අවධානයක් යොමු වී නොමැති බව පේනවා. ඒ පිළිබදව මම බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. තිබෙන සියළුම පාරවල් භාවිතා කල නොහැකි තත්වයේ පවතින අතර අතුරු මාර්ග එකක්වත් කොන්ක්‍රීට් කර නැහැ. ඒ නිසා මම ඔබතුමන්ගෙන් හා සියළුම මන්ත්‍රීවරුන්ගෙන් මේ පිළිබදව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. උනන්විටිය බුදපනාගම ප්‍රදේශයේ පානීය ජල හිගයක් පවතිනවා. ගගේ කොපමණ ජලය තිබුනත්, මිනිසුන්ට පානය කිරීමට ජල ව්‍යාපෘතියක් නැහැ. පසුගිය කාලය තුල ලක්ෂ 28 ක් පමණ වැය කර උනන්විටිය ප්‍රදේශයේ අසාර්ථක ජල ව්‍යාපෘතියක් සිදු කලා. පාර පුළුල් කරන අවස්ථාවේදී එම බටවලට හානිවෙලා තියෙනවා. බුදපනාගම කන්දේ ජල ව්‍යාපෘතියක් සකස් කර බුදපනාගමට, උනන්විටියට ජලය ලබා දුන්නත්, එය සති දෙකකට, තුනකට පමණ සීමා වුනා. එම ව්‍යාපෘතිය මුදල් නාස්තියකට හේතු වුණා. මෙහි නිවේදන යටතේ සදහන් කරන ලද ලිපිය අනුව පානීය ජල ව්‍යාපෘති ඉල්ලුම් කර ඇති ප්‍රදේශයක් ලෙස මෙම බුදපනාගම කොට්ඨාශයේ පවුල් ඇතුළත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම බද්දේගම උඩුගම මාර්ගය පළල් කිරීමේදී උනන්විටිය මංසන්ධියේ මගී ආවරණය කඩා දාලා තිබුනු හෙයින් එම මගී ආවරණය සකස් කිරීමට පිරිසක් එකතු වුණා. මෙහිදී ඉඩමේ අයිතිය පිළිබදව ගැටළුවක් මතු වුනා. එබැවින් කලින් මගී ආවරණය තිබූ ස්ථානයට අඩි 2 ක් පමණ

පසුපසට කර එම මගී ආවරණය ඉදිකිරීමට මාර්ග අධිකාරියේ අවසරය ඉල්ලා ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඉඩමේ අයිතිකරුවන් විසින් වර්තමානයේ එය සවි කර ඇති ස්ථානයේ ගඟේ ඇතුලෙන් කුහරයක් පවතින බැවින් කණ්ඩිය කැඩී යාමේ අවධානමක්ද පවතිනවා. ඒ වගේම බුදුපනාගමටත්, උනන්විටියටත් එවැනි ආවරණයක් සවි කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

තවද, අපි කලින්ප්‍රතිසංස්කරණය කරපු උනන්විටිය මංසන්ධියේ තොටුපල හා ලියනගහවිට තොටුපල යන දෙකේම වල් බිහිවෙලා. එම තොටුපලවල් දෙක ශුද්ධ පවිත්‍ර කර මඟින් ගෙනයාමට ඇති බෝට්ටුවද ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම පාරවල් දෙපස තණකොල වැවී ඇති බැවින් තණකොල කපන මැෂින් මිළදී ගෙන ඉක්මණින් එම පාරවල් ශුද්ධ කර දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. නාගොඩ හංදියේ ඉදලා උඩවැලිවිටිතලාව, ගම්මැද්දේගොඩ, රෑකඩහේනට යන ප්‍රධාන මාර්ගයේ අලුත් පාලමේ සිට මීටර් 80 ක් පමණ දුරක් තාරවත්, කොන්ක්‍රීට්වත් නැහැ. ගල් පෑදිලා යතුරු පැදියකට පවා යාමට ඉතා අපහසු තත්වයක පවතිනවා. එම ස්ථානයට අඩි 2 ක් වත් පස් දමා ගොඩ කර තාර හෝ කොන්ක්‍රීට් දාලා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ දිනවල වැසි සහිත කාලගුනයක් පවතින බැවින් අලුත් පාලමද ලිස්සන සුළු ස්වභාවයක් පවතිනවා. බයිසිකල් වුනත් නිතර වැටෙන ස්වභාවයක් පවතිනවා. ඒ සඳහාත් කාපට් යොදනවා නම් හොඳයි. ඒ වගේම තමයි ට මෙගොඩ නාගොඩ පැත්තට වන්නට පාරේ අද වගේ වැසි දිනක කිසිසේත්ම යාමට නොහැකි තත්වයක් පවතිනවා. ඒ වගේම ගංවතුර අවස්ථාවේදී නාගොඩ හංදිය යටවීමට පෙර ඇල්පිටිය නගරයට තිබෙන ප්‍රධාන මාර්ගය වන උඩවැලිවිටිය රෑකඩහේන ප්‍රධාන මාර්ගය යට වන බැවින් එය අඩි 2 ක් වත් උස්කර කොන්ක්‍රීට් කර පාර ප්‍රතිසංස්කරණය කරන්න කියා ඉල්ලා සිටිනවා. උඩවැලිවිටිය ප්‍රදේශයේ වීථි පහන් මේ වන විට අක්‍රිය තත්වයේ පවතින බැවින් එම පහනුත් සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

මෙහිදී උඩවැලිවිටිය ප්‍රජාශාලාව ගැන කතා කළා. ඇත්තටම ගමට පාසලක්, පංසලක් වත් නොමැති වේලාවක වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතාවට ලැබුනු මේ ශාලාව යම් කිසි කොට්ඨාශයකට පමණක් නොදී සයල්ලන්ටම පොදුවේ භාවිතා කිරීමට හැකි වන අයුරින් සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. මෙහි යතුර ග්‍රාම නිලධාරිතුමා භාර යේ තිබුනාට ප්‍රශ්ණයක් නැහැ. ඒ පිලිබඳවද මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මාපලගම උප කාර්යාලය ගැන කතා කරන විට ඔවුන්ට ජල අවශ්‍යතාවය දැඩි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. එහි මෝටරය සභාවෙන් ගලවන් ඇවිත් තියෙනවා. මෝටරය නැවත ඔවුන්ට සකස් කර දිය යුතු වෙනවා. ඒ වගේම අපි සබාවට ආපු දවසේ සිටන්ම අහන්න වෙන්නෙ වැඩක් කරන්න සභාවට සල්ලි නෑ කියලා. අපේ ගමේ කිසිම වාහනයක් ගමන් කිරීමට නොහැකි ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය වන 1 Km ක් පමණ කොටසක් තියෙනවා. ගමේ ගම්වැසියෝ එකතු කර ගෙන එම කොටස ප්‍රතිසංස්කරණය කිරීමට මම තීරණය කරලා තියෙනවා. ඒ වගේම මේ මාසෙ 24 වෙනිදා මගේ පළමු වැටුප ගමේ දුප්පත් නිවාස දෙකක අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදවනු ලැබුවා. ඒ වගේම මෙවර වැටුපෙන්

මම ඉහත සදහන් මාර්ගය සදහා එම මුදල් වැය කරලා එය සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මෙම මස 24 දින අපේ පරණතානායම්ගොඩ ගමට ඇවිත් අපිත් එක්ක ඒ කටයුත්තට එකතු වෙන්න කියලා මම අපේ ගරු සභාපතිතුමාගෙනුත්, සියළුම මන්ත්‍රී මණ්ඩලයෙනුත් ඉල්ලා සිටිනවා. අපි සභා ප්‍රතිපාදන එන තෙක් නොසිට ස්වේච්ඡා සංවිධාන කිහිපයක් සහ ව්‍යාපාරිකයින් එකතු කර ගනිමින් මුදල් එකතු කර ගෙන සිදු කරන මේ ශ්‍රමදාන කටයුත්තට සභාවේ කම්කරුවන් ලබා දිය හැකි සියළුම උපකරණ, යන්ත්‍ර සූත්‍ර වාහන ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. අපි පඩි අරගන්න, රැකියාවල් සොයන්න මෙහි ආවෙ නැහැ. ගමේ මිනිසුන්ගෙ කැමැත්ත මත ආපු අපි මුදල් මගින් කරන්න අවශ්‍ය වෙන්නෙ ඒ වගේ වැඩ. මේ සභාවෙ සමහර කරුණු වලදී අපි අදහස් ප්‍රකාශ කර නොසිටියෙ යම් යම් දේ සම්බන්ධ අවබෝධයක් නොතිබු නිසා වන අතර කලින් කතා කල නිලධාරී පුහුණුව වෙනුවෙන් රු.50000.00 ක මුදල් වෙන් කිරීමේදී මම ඒ සම්බන්ධව මුලින් කතා කරනවා. නමුත් එම නිලධාරීන් යොදවන ක්‍රමවේදය පිළිබද පැහැදිලි අවබෝධයක් නොතිබූ නිසා අපි පසුගාමී වුනා. මින් පසු එම කරුණු ඉදිරිපත් කිරීමේදී හැමෝම දැනුවත් වන ආකාරයට කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. කොට්ඨාශ 15 ක් නියෝජනය කරමින් මම ජනතා විමුක්ති පෙරමුණෙන් නිස්සරන අධ්‍යයනයක් තමයි මම කර ගෙන යන්නෙ. අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වගේ අපි තමයි අපේ දීමනාව මහජනයාට දුන්නේ. මෙතෙක් යෝජනා වූ කරුණු අතුරින් මුලින්ම සභාවෙන් පටන් ගත්තොත් පුස්තකාලය තමයි අපට ප්‍රධානම දේ. අපේ මනස ක්‍රියාත්මක වෙන්නෙ පොත් ගුල හරහා. පුස්තකාලයට මෙතෙක් කල් පරිගණකයක් තිබිලා නැහැ. එයට පරිගණකයක් ලබා දුන්නොත් ඉතා වැදගත් වෙනවා. පුසුතකාලය තුල කටයුතු කළමනාකරණය කිරීමේදී එය පොත්පත් වලින් පමණක් සිදු කර ගත නොහැකි බවත්, පරිගණයක් ලබා දෙනවානම් හොදයැයි පුස්තකාලයාධිපතිතුමිය අපි සමග ප්‍රකාශ කළා. එය යෝජනාවක් ලෙස පිළිගන්න කියලා මම ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගිය සභා වාරයේදී කතා වුනු සියළුම මන්ත්‍රීවරුන්ට සීල් ලබා දෙන එක ගැන ඊට පසුවට සදහනක් වුනේ නැහැ. ඒ වගේම අපට වැඩි ලාභයක් ලබා ගන්න පුළුවන් දෙයක් තමයි කොම්පෝස්ට් පොහෝර අපි එම ස්ථානය නිරීක්ෂණයට ගියා එතන පොහොර සකස් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නැහැ. හැලීමේ ක්‍රියාවලිය සිදුවන්නේ යන්ත්‍ර මගින් නොවෙයි. කොම්පෝස්ට් යන්ත්‍රයකට දමා එම ක්‍රියාවලිය සිදු වෙන්නේ නැහැ. කොම්පෝස්ට් ක්‍රමවේදය එසේ සිදු නොකරන අතර එතනට වෙනමම යන්ත්‍රයක් තියෙනවා. අපි ගැමිදිරිය සමාගමේ සිටින විට එම සමාගමට රු. ලක්ෂ 3 කට යන්ත්‍රයක් ලැබුණා. ඒක බහුකාර්ය යන්ත්‍රයක්. 3000 Kg ක ප්‍රමාණයක් දිනකට ඇඹරීම සිදු කරගන්න පුළුවන්. ඒක සභාව හරහා ගැමිදිරිය සමාගමෙන් ලබාගන්න. ගැමි දිරිය සමාගම සමග කතා කර මෙම යන්ත්‍රයක් සභාවට ලබා ගන්නා ලෙස කටයුතු කරන්න. ඒ වගේ යන්ත්‍රයක් ලබන මාසෙ වුවත් ලබා දෙන්න පුළුවන්. තවද කන්නැලිය ප්‍රදේශයේ කුණු ගෙන ඒම පිළිබදවද ගරු සභාපතිතුමාගෙන් කරුණු විමසූ අතර ඒ සදහා අපට මුදල් ගෙවනු ලබන බවද ගරු සභාපතිතුමා පැවසූහ.

තවද අප ගම් ප්‍රදේශයේ ප්‍රධාන ප්‍රශ්නයක් තමා මත්ද්‍රව්‍ය උවදුර ඒ සම්බන්ධව පොලිස්පතිතුමන් සමග සාකච්ඡා කළා. එතුමාගේ අත් ඒ සම්බන්ධයෙන් හිර කරලා තියෙන්නේ. මත්ද්‍රව්‍ය එතුමාට අල්ලන්න බැරි බව එතුමා සදහන් කළා. අපි අහන්නේ කසිප්පු කියන දේ විෂම ද්‍රව්‍යයක් නෙමෙයිද කියලා. එතුමා කියන ආකාරයට කුඩු, ගංජා වැනි මත්ද්‍රව්‍ය අල්ලන්න පුළුවන්. නමුත් ඒවා විනාශ කිරීමේ හැකියාවක් පොලීසියට තියෙනවා. නිශ්පාදනයන් විනාශ කරනවානම් ඇල්ලීමක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ සම්බන්ධව දැනුවත් කරන ලෙස මම අපේ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගංවතුර වැනි ආපදා තත්වයකදී අපට සිටීමට සුරක්ෂිත ස්ථානයක් නැහැ. එහිදී අපට අවම වශයෙන් සවිබල බෝට්ටු, ආරක්ෂිත ජැකට් නැහැ. නාවික හමුදා බෝට්ටු එන කොට වැඩේ කෙරිලා ඉවරයි. මේ පිළිබඳව ක්‍රමවේදයකුත් ඇති කරමු යන්නන යෝජනා කරමින් සැමට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගම්මැද්දේගොඩ පඤ්ඤාලෝක මාවත මේ වෙන කොට දැඩි ලෙස අබලන් වෙලා තියෙනවා. රෝගියෙක්වත් අරන් යාමට හැකියාවක් නැහැ. ඒ පාරෙන් හයර් එකක්වත් යන්නෙ නැහැ. ඒ වගේ අවස්ථාවක සුමිතුරු ස්වේච්ඡා සංවිධානය එකතු වී මේ මස 26 වන දින ලොකු ශ්‍රමදානයක් සංවිධානය කරලා තියෙනවා. යම් යම් ආයතනවලට ලිපි භාර දී ඒ ලැබෙන ආධාරවලින් යම් ආකාරයකට පාර සකස් කර ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. එම අවස්ථාවට ප්‍රාදේශිය සභා කම්කරුවන්ගේ සහයෝගය සහ යන්ත්‍රෝපකරණ හා වාහන ලබා දී අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමන් විසින් එය ඉටු කර දීමට පොරොන්දු විය.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි එන්. වී. සමන් මහතා :-**

ගරු සභාපතිතුමන් ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. හෝමදොල කොට්ඨාශයේ බොහෝ මාර්ග සෝදා පාලුවට ලක් වෙලා තියෙනවා. බොහෝ අබලන් තත්වයක පවතිනවා. ඒ පිළිබඳව ඔබතුමන්ගේ විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා. සියළුම මන්ත්‍රීවරුන් වෙත එම පාරවල් සෑදීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් සාදා දෙන මෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම උඩුගම හෝමදොල උඩුගම පොල පවතින ස්ථානයේ ත්‍රීරෝද රථ ගාල් කිරීමට දැනට අවසර ලබා දී ඇති බවත් එයට අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ කුරුපනාව පාර දිනකට වාහන 100 ක් පමණ ගමන් කරනු ලබන විදේශ විනිමය උපයනු ලබන මාර්ගයක්. එහි ගමනාගමනයට ඉතාම අත්‍යවශ්‍ය මේ මාර්ගය අබලන් තත්වයක පවතිනවා. මේ පාර දෙපස ගස් වැටී ගමන් කිරීමට අසීරු තත්වයක පවතිනවා. අපි මුල් අදියරේදී කුරුපනාව කර්මාන්තශාලාව සමග සාකච්ඡා කරලා ශ්‍රමදාන මට්ටමින් පාර ශුද්ධ පවිත්‍ර කිරීමට කටයුතු කරනවා. පාරේ වලවල් ගොඩකිරීමට සභාවේ වාහනයක් හා ශ්‍රමිකයින් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. එම නිසා එම අවශ්‍යතාවයන් ඉටු කරන ලෙස සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අප ප්‍රදේශයේ වීථි ලාම්පු කැඩී ඇති බැවින් ඒවා නැවත සවිකර දෙන ලෙසද ඉල්ලා සිටින අතරම කොම්පෝස්ට් අලවිය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අඩු නිසා කොම්පෝස්ට් අලවිය වර්ධනය කර ගැනීම සඳහා උප කාර්යාලවල ඒ පිළිබඳ බෝඩ් එකක්ද සවි කරන මෙන් යෝජනා කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී පතිනායක මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ කොට්ඨාශයේද අබලන් වූ මාර්ග බොහෝමයක් පවතිනවා. ඒ අතරින් ඉතාම අබලන් මාර්ගයක් තමයි උඟරල - නෑහිනිගල සරණතිස්ස මාර්ගය ප්‍රධාන පාර ආරම්භයේම කන්දක් තියෙනවා. මෙහි බයිසිකලයක්වත් ගමන් කිරීමට නොහැකි තත්වයක් උද්ගත වෙලා තියෙනවා. තවද චන්ද්‍රා සහබන්දු මහතාගේ නිවස අසලින් යන පාරද රෝගියෙක්ත් රැගෙන යාමට අපහසු පරිදි අබලන් වෙලා තියෙනවා. ඒ මාර්ගයෙන් දිනකට විශාල පිරිසක් ගමන් කරනවා. ඒ සඳහා සභාවේ විශේෂ අවධානය යොමු වීම ඉතාම අත්‍යවශ්‍ය දෙයකි. අපේ කොට්ඨාශයේ පවතින අබලන් පාරවල් අතුරින් අවධානය යොමු කිරීම සම්බන්ධ ප්‍රමුඛතාවය මේ පාරට ලබා දිය යුතුයි. මේ පිළිබඳව සභාවට නොයෙක් වර දැනුවත් කරලා තියෙනවා. එහෙයින් නැවත වාරයක් මේ පිළිබඳ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා. මෙහිදී එම පාරට සම්බන්ධ අනිත් පාරේ කොන්ක්‍රීට් ලෑල්ල ඉවත් නොකර එම පාර කාපට් කරත් කිසිදු වැඩක් නොවන බවද ඉහත පතිනායක මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීම්වලට එකගවෙමින් චන්ද්‍රා සහබන්දු මහතාද තම එකගතාවය පළ කරන ලදී. ඒ සඳහා ඇස්තමේන්තුවක්ද සාදා දෙන ලෙසද එතුමන් ප්‍රකාශ කරන ලදී.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා :-**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මොරගල්මුල්ල මාර්ගයේ පවතින ඊ. කේ. ඊබට් සමාගම අමුද්‍රව්‍ය ගබඩාවක් හා කාර්යාලයක් පවත්වා ගෙන යනවා. එම කාර්යාලය පවත්වා ගෙන යනු ලබන්නේ මාර්ග නඩත්තු ඒකකයෙන්. මෙහි පාර මාඉම්බඩ ඇළට මායිම් වෙලා තියෙනවා. ඒ නිසා එම මාර්ගය ගිලා බැසීමට ලක් වෙලා තියෙනවා. මේ පිළිබඳව ලිඛිතව දැනුවත් කරලා තියෙනවා. පසුගිය දිනවල ගයාත්‍රි මන්ත්‍රීතුමියත් එම ස්ථානයේ ශ්‍රමදාන කටයුත්තක් කළා. ඉදිරියේදී මෙම මොරගල්මුල්ල පාර සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරන්න. බර ටොන් 05 ට වඩා වැඩි වාහන ඇතුළු කිරීම තහනම් කරන්න. පාර අබලන් වුවොත් ඒකෙ පාඩුව දැනෙන්නෙ ජනතාවට, ඒකෙ අපහාස විඳින්න වෙන්නෙ ගමේ මන්ත්‍රීවරයා හැටියට මට. එබැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

තවද අපි විවිධ කමිටුවලට පත් කර ගත්තා. ඒ කමිටුවලින් කෙරෙන්නේ කුමක්ද යන්න පිළිබඳව අපිට කිසිදු දැනුවත්භාවයක් නැහැ. ඒ නිසා එම කමිටු සම්බන්ධව අපව දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා. මම මුලින් කරන ලද යෝජනා පිළිබඳව සළකා බලන ලෙසත් නැවත් වරක් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී ගයාත්‍රි කුමාරි මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මොරගල්මුල්ල පාරේ බාර්හංදිය වටා යටවීම සම්බන්ධව කතා කලොත් ඇළ දොළ මාර්ග ඔක්කොම ගොඩ වී තිබෙන නිසා වතුර බහින්නෙ නැහැ. ගිය මාසේ පෝය දවසේ මමත්, ග්‍රාම සංවර්ධන සමිතියත්, ගම්වැසියනුත් එකතු වී එම මාර්ගය ගොඩනැගීමට ශ්‍රමදානයක් සිදු කළා. සභාවේ ට්‍රැක්ටරය ලබා දීම පිළිබඳව

ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. මෙහිදී දේශපාලන භේදයකින් තොරව එක්ව කටයුතු කිරීමට පැමිණෙන ලෙස එතුමිය ප්‍රකාශ කළා. ගමේ යටිතල පහසුකම් සංවර්ධනය කරනවා වගේම ජනයාගේ ආධ්‍යාත්මික සතුට වැඩි දියුණු කිරීමටත් අපි දේවල් කරන්න ඕන. ඒ නිසා මම මගේ පඩිය වැය කරලා ග්‍රාම නිලධාරී සමිතියේ සියළු දෙනාත්, වැඩිහිටි සමිතියේ සියළු දෙනාත් වන්දනා ගමනකට එකතු කර ගත්තා. ඒ වගේම පාරේ ඉතුරු කොටස ශ්‍රමදානය කිරීමට අපි ලබන පෝය දිනය යොදා ගත්තා. ලබන 29 වන දින එම ශ්‍රමදාන කටයුත්තට ඔබ සැමගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි චන්දිමා දිල්රුක්ෂි මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ ගයාන් මන්ත්‍රීතුමන් කල යෝජනාවට මමත් එකග වෙනවා. අද මම ලේකම්තුමියට එම යෝජනාව ලිඛිතව භාර දුන්නා ඒ විතරක් නොවෙයි කොව්ලාන හංදිය ළගත් සාමාන්‍ය වැස්සකට පවා වතුර පිරිලා පාසල් ළමුන්ටවත් යාමට නොහැකි තත්වයකට පත් වෙලා තියෙනවා. ඒ නිසා ඒ මාර්ගය දෙපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මලාමුර වී මෝල අසල කුලතුංග කඩේ ඉදිරිපිට බෝක්කුව ගිලා බහිමින් පවතිනවා. ඒ වගේම 6/4 පාලම යටින් දිරාපත් වෙලා තියෙන නිසා එයද සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඊට අමතරව මලාමුර හා මාපලගම ප්‍රදේශවල පවතින වීථි පහන් සාදා දෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මෙහි සෑම දෙනාම මාර්ග පිලිබදව කතා කළා. ප්‍රාදේශීය සභාවේ සෑම කොට්ඨාශයකටම වැදගත් වන ප්‍රශ්නයක් තමයි මම කතා කරන්නේ. එනම්, ප්‍රාදේශීය සභා පාරවල් තිබුනත්, විධිමත් ආකාරයට ප්‍රාදේශීය සභා පාරක් ලෙස ගැසට් කර සභාවට පවරා නොගත් පාරවල් තමයි තියෙන්නේ. අපට නඩත්තු කල නොහැකි පළාත් සභාවට පැවරිය යුතු මාර්ග රාශියක් තියෙනවා. අපේ මන්ත්‍රීතුමිය කතා කල ආකාරයට නාගොඩ මංසන්ධියේ සිට ඉදිගහවිල මාර්ගය ඉතාමත් වැදගත් මාර්ගයක් වෙනවා. මොකද ඇල්පිටිය ප්‍රදේශයට ගංවතුරක් පැමිණි විට විකල්ප මාර්ගයක් ලෙස යොදා ගැනීමට හැකි මාර්ගයක් වනවා. තවමත් මෙය සභාව සතු පාරක් නමුත් අපි විධිමත් වැඩපිළිවෙලක් යටතේ එම පාරවල් පළාත් සභාවට පවරා දීලා පළාත් සභාව යටතේ වැඩි දියුණු කලොත් මීට වඩා හොඳ මාර්ග පද්ධතියක් හදා ගන්න පුළුවන්, ඒ සඳහා අපට හොඳ මුදල් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. බදු මුදල්වලින් තමයි අපට මේවයේ නඩත්තු කටයුතු කරන්න සිදු වෙලා තියෙන්නෙ. ගම්මැද්දෙගොඩ, ගෝණලගොඩ පාරවල් ගැන තමා මම ප්‍රකාශ කලේ. ප්‍රාදේශීය සභාව සතු අතුරු මාර්ග සියල්ලම ප්‍රාදේශීය සභාවට පවරා ගෙන එකම ගැසට් පත්‍රයකින් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සිදු කරන්න යැයි මම ඉල්ලා සිටිනවා. මම දැනට උඩවැලිවිටිය ප්‍රදේශයේ මාර්ග කිහිපයක් වෙනුවෙන් අධිකරණයේ නඩුවලට පෙනී සිටිනවා. අදටත් උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ මාර්ගය වෙනුවෙන් නඩුවක් පවතිනවා. එයට අපේ ලේකම්තුමියත් සම්බන්ධවෙලා තොරතුරු නොපැකිලිව ඉදිරිපත් කළා. ඒ මාර්ගයේ 50 % කට වඩා වැඩියෙන් සකස් කරලා ඉවරයි. මෙහිදී එම අතුරු මාර්ග හඳුනා ගැනීමට කමිටුවක් පත් කර එම පවරා ගැනීම් කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ප්‍රාදේශීය සභාව තුල සිටින්නෙ ඉතා අඩු කම්කරු පිරිසක්. වෙනත් සභාවල, නගර සභාවෙ වගේ නඩත්තු ඒකකයක් අප ප්‍රාදේශීය සභාව තුළත් පිහිටුවීමට මම යෝජනා කරනවා. මෙම අතුරු මාර්ගවල කැලේ වැවිලා යන්න බැහැ කියලා හැමෝම පවසනවා. ඒ නිසා නඩත්තු

ඒකකය තුළින් විශාළ වැඩක් කරන්න පුළුවන්. එයට තාවකාලික සුපර්වයිසර් කෙනෙකු පත් කරලා එය ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වගේම අපට ඉන්නෙ කම්කරු මහත්වරුන් හතර පස් දෙනයි. ඔවුන්ටද නිවැරදි නායකත්වයක් නැහැ. අපේ හැම පාරක් සඳහාම තාක්ෂණික නිලධාරී මහත්වරුන් යොදවලා දිනකට කරන්න පුළුවන් මට්ටමේ වැඩ ප්‍රමාණයක් සඳහන් කරලා ඇස්තමේන්තුවක් හදලා සුපර්වයිසර් මහතාගේ අධීක්ෂණයට අනුව අදාළ දින ගණනින් එම මාර්ගයේ වැඩ කටයුතු ටික නිම කරන්න ඕන. නැත්නම් මේ ප්‍රශ්නවලට විසඳුමක් ලැබෙන්නෙ නැහැ. ඒ වගේම විශ්‍රාම ගිය සේවකයන් වෙනුවෙන් අලුතින් සේවකයන් බඳවාගෙන අවශ්‍ය පහසුකම් සළසමින් මාර්ග සකස් කිරීමට වැඩපිළිවෙලක් සෑදීම පිළිබඳව මම යෝජනා කරනවා.

ඒ වගේම අපේ ප්‍රාදේශීය සභාව තුළ තිබෙන වත්කම් වාහන , භාණ්ඩ, කාර්යාලීය උපකරණ ඇතුළු සියළුම දේපල පිළිබඳව සංගණනයක් කළ යුතුයි. ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සෑදිය යුතුයි. එම වත්කම් පිළිබඳව අපේ සියළු මන්ත්‍රීවරුන් දැනගැනීමට කැමැත්තක් දක්වනවා. ඒ වගේම අපට කොපමන ඉඩම් ප්‍රමාණයක් අප සතුද කියලා කොහේවත් විධිමත් ලෙස සඳහනක් නැහැ. ඒ නිසා අපේ ලේකම්තුමියගේ, නිලධාරීන්ගේ යටතේ ගරු සභාපතිතුමාගේ නායකත්වය යටතේ කමිටුවක් පත් කර සංගණනයක් සිදු කරන ලෙස මා නැවත වරක් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභා බල ප්‍රදේශ පටන් ගන්නා ස්ථානය, අවසන් වන ස්ථානය පිළිබඳ නිර්නායක නැහැ. තිබුනත් ඒවා දිරාපත් වෙලා එම නිසා එවන් ස්ථානවල ප්‍රාදේශීය සභා සීමාව අවසානයි වගේ දැන්වීම් පුවරු ගැසීම වැදගත් වෙනවා. ඒවා සකස් කරන ලෙසද ඉල්ලා සිටිනවා.

ඇත්තටම උඩවැලිවිටිය ප්‍රජාශාලාව පිළිබඳව කතා කරනවානම්, එම ප්‍රදේශයේ රැස්වීමක්වත් පැවැත්වීමට ස්ථානයක් නොතිබූ අවස්ථාවක අපේ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගම නැගුම සංකල්පය යටතේ ලක්ෂ 7 ක අරමුදලකින් ආරම්භ කල එම ප්‍රජා ශාලාව අද වන විට සම්පූර්ණ ඉදිකිරීම් කරලා ඉවර වෙලා තියෙනවා. ඇත්තටම ඒ ගැන මම හදවතින්ම සතුටු වෙනවා. ඒ පිළිබඳව අපේ ගරු සභාපතිතුමන් දන්නවා. ඔබතුමා ඒ වන විට මන්ත්‍රීවරයෙක් ලෙස මට උදව් උපකාර කළා. සමහර නිලධාරීන් ඒ සම්බන්ධව විරුද්ධවද කටයුතු කළා. මෙහි මූලාරම්භය ගැන දන්නා කෙනෙකු හැටියට ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සභාවට නඩත්තු කටයුතු පවරා දීමට ගිවිසුමකට එළඹිලා තියෙනවා. ඒ වගේම අක්කර 2 1/2 ක භූමි ප්‍රමාණයක් අපි පොදු අරමුදලෙන් මේ සඳහා විශාල මුදලක් වැය කරලා ඒවායේ මැණුම් කටයුතු කරලා තියෙනවා. මම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන 2008 කාලයේ රු. 35000.00 ක් වැනි විශාල මුදලක් වැය කර එහි හතරමායිම් මැනලා තියෙනවා. එහි ඔප්පුව පවරා ගැනීමේ කටයුත්ත පමණයි අපට ඉතුරු වෙලා තියෙන්නෙ. ප්‍රාදේශීය ලේකම්තුමා, පළාත් සභා මහ ඇමතිතුමා අදාළ කැබිනට් පත්‍රිකාවකින් තමයි මෙය ප්‍රාදේශීය සභාවට පැවරුවේ.

ඒ වගේම උඩවැලිවිටිය ගමට පෙර පාසලක් නැහැ. බුදපනාගමටත්, රෑකඩහේනටත්, ගම්මැද්දේගොඩ වගේ වෙනත් ප්‍රදේශවල පෙර පාසල්වලට යන්න සිදු වෙලා තියෙනවා. ලබන ජනවාරි මාසය වන විට උඩවැලිවිටිය ප්‍රදේශයටත් පෙර පාසලක් පටන් ගන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ඔබ සැමගේ ශක්තිය අපට ලබා දෙන්න.

ඒ වගේම වීථි ලාම්පු සවි කිරීම පිළිබඳව කතා කළා. අපේ ගරු සභාපතිතුමන් ලබන මස 10 වන දා වීථි පහන් සවි කරන බවට පොරොන්දු වෙලා තියෙනවා. මම විශ්වාස කරනවා එය ඉටුවෙයි කියලා. මේ කරුණ නිසා පෝය දවසේ මම ගම්වාසීන්ගේ දොෂ දර්ශනයට ලක් වුණා. අඩුම තරමේ උඩවැලිවිටිය මහා විද්‍යාලය ඉදිරිපිටවත් වීථි ලාම්පු සකස් කර නැහැ. පාසල ඉතාම කරුවලේ. රෑට අයාලේ යන ගවයින් පවා පාසල් වත්තට ඇතුළු වෙනවා. මේ සම්බන්ධව විදුහල්පතිතුමාගෙන්ද ඉල්ලීමක් ලැබෙයි. එම ඉල්ලීම ඉටු කරන ලෙසද ඉල්ලා සිටිනවා.

ඇත්තටම ගරු ලේකම්තුමියනි, ඔබේ කාර්ය මණ්ඩලය ඉතාම දක්ෂයි. නමුත් ඔවුන්ට මාර්ගෝපදේශකත්වය හා නිවැරදිභාවය පිළිබඳ අඩුපාඩුකම් පවතිනවා. ඒවා නිවැරදි කර ගෙන හොඳ ප්‍රාදේශීය සභාවක් ලෙස අපිට ඉදිරියට යන්න පුළුවන්. දැන් ප්‍රාදේශීය සභාවේ වෙනදට වඩා විධිමත් වැඩපිළිවෙලක් තියෙනවා. ඒ නිසා අපට ප්‍රාදේශීය සභාවේ හොඳ පරිවර්ථනයක් කරන්න පුළුවන්.

ඒ වගේම අපි සියළුම මන්ත්‍රීවරුන් එක්ක ශ්‍රමදාන වැඩපිළිවෙලකට ගිහින් අපේ මාර්ගයන් ශුද්ද පවිත්‍ර කර ගමන් කිරීමට නොහැකි මාර්ගයන් නැවත සකස් කිරීමට වැඩපිළිවෙලක් සෑදීම අවශ්‍ය වන අතර ඊට අදාළ පසුබිම සළස්වන මෙන් ඉල්ලා සිටිනවා.

අපේ උඩවැලිවිටිය හොරංගල්ල මාර්ගය ගැන කතා කලොත්, අද තත්වය තමයි බයිසිකලයෙන් ගියොත් බයිසිකලයේ පැච් එකක්, දෙකක් යනවා. ඒ තරමට පපාර අබලන් වෙලා. එයට හේතුව අවිධිමත් කොන්ක්‍රීට් කිරීම, මේ සම්බන්ධව මටත් චෝදනා එල්ල වුනා. නමුත් මෙහි කොන්ත්‍රාත් එක සිදු කලේ මලාමුර ප්‍රදේශයේ පුද්ගලයෙක් නමුත් ඔහු එය ඉතා අවිධිමත් ආකාරයෙන් ඉටු කර මුදල් ලබා ගෙන තියෙනවා. මේ ප්‍රදේශයේ ඇති ඉතාම අබලන්ම මාර්ගය තමයි ඒ ඒ පිළිබඳව ප්‍රමුඛ කර කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමින් සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි තරංග සුදර්ශන මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. අද බොහෝ යෝජනා ඉදිරිපත් වුණා. අප පෙර සභාවේදී විවිධ යෝජනා සිදු කළා. අපි මෙතන කතා කරන්නේ මූලාසනයට, මූලාසනයට තමයි අපි ඉල්ලීම් කරන්නේ. එහිදී අපි බාහිර ආයතනවලට යම් යෝජනාවක් සිදු කර ඇති විට එම වැදගත් යෝජනාවල පිටපතක් හා එම යෝජනා ආයතනවලට යොමු කිරීම පිළිදව පිටපත් අපට ලබා දීමට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ සඳහා අදාළ මාසයේම නිසි ක්‍රියාමාර්ග ගන්න. සියළුම මන්ත්‍රීවරුන් මෙතන කතා කරලා ගියාට පස්සෙ එතනින් එහාට ඒවා සිදු වූවාද නැද්ද යන්න පසු විපරමක් අපට කරගන්න පුළුවන්. එම ලිපිවල පිටපත් අපට ලබා දෙන්න.

ඒ වගේම උඩුගම නියෝජනය කරන අපේ වෙරංග ලක්මාල් ගරු මන්ත්‍රීතුමන් නවක මන්ත්‍රීවරයෙක් ලෙස හොඳ වැදගත් යෝජනාවන් රැසක් ඉදිරිපත් කළා. ඒ සියල්ලම ඉටු වෙන්න ඕන කියලා මම යෝජනා කරනවා. මමත් මගේ දරුවා රැගෙන යන්නෙ උක්ඕවිට ප්‍රාදේශීය සභා පෙර පාසලට තමයි. ඒ නිසා එතැන වැට පිළිබඳ කතා කරන්න ඕන. ඇත්තටම ඔය යෝජනාව කලින් ඉදිරිපත් කලේ මම නමුත් උඩුගම ප්‍රදේශයට ශක්තියක් දුන් වෙරංග මන්ත්‍රීතුමන් ඉතා හොඳ යෝජනා ටිකක් ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් එම යෝජනා සභාව හරහා කොතෙක් දුරට ඉටු කර ගත හැකිද යන්න සළකා බැලිය යුතු වෙනවා. අපි ඒ දවස්වල වැසිකිලි, කැසිකිලි ත්‍රිරෝද රථ ගාල ගැන විශාල වශයෙන් කතා කලා. අපේ හිටපු සභාපතිතුමා, උප සභාපතිතුමා නියෝජනය කලේ උඩුගම ප්‍රදේශය නමුත් එම යෝජනා ඉටු කර ගන්න බැරිවුණා. මේ සභාවට ඒ යෝජනා අලුත් වුනාට අපි ගිය සභාවල හිටි මන්ත්‍රීවරුන් ලෙස ඔය යෝජනා කලිනුත් ඉදිරිපත් කළා. ඒ වගේම ආදාහනාගාර වෙළඳ සංකීර්ණ වැනි යෝජනා ක්‍රියාත්මක කිරීමට අපට විශාල මුදලක් අවශ්‍ය වෙනවා. මේ සභාවේ ආදායම මසකට ලක්ෂ 3 ක් පමණ වෙනවා. එයින් අපට කරන්න පුළුවන් දේ අපි දන්නවා. වෙළඳ සංකීර්ණයක පදනමවත් දාන්න ඒ මුදලින් බැහැ. ඒ නිසා අපි පළාත් සභාවත්, මධ්‍යම රජයත් සමග එකතු වෙලා නිශ්චිත ක්‍රමවේදයක් යොදා ගෙන එම යෝජනා ටික ඉටු කර ගැනීමට ඔබතුමන්ගේ විශේෂ අවධානය යොමු කරන්න යැයි ඉල්ලා සිටිනවා.

ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කල ආකාරයට අපේ නවක මන්ත්‍රීවරු අපේ සභාව ෂතු දේපළ පිළිබඳව, වාහන, බවුසර්, යන්ත්‍ර සූත්‍ර ගැන, නිලධාරීන් ගැන දැනුවත් නැහැ. ඒ ගැන දැනුවත් කිරීමට වැඩමුළුවක් පවත්වන්න යැයි මා යෝජනා කරනවා. එතකොට ඔවුන් ඒ සඳහා හොඳ යෝජනා ඉදිරිපත් කරාවි.

ඒ වගේම, ශ්‍රවනාගාරයට බෝඩ් එකක් තවම නැහැ. සභාවේ තියෙන ලොකුම දේපල තමයි මේ බහුකාර්ය ගොඩනැගිල්ල මෙම ශාලාවේ උත්සවයක් පවතින අවස්ථාවේ මිනිසුන්ට මෙම ස්ථානය සොයා ගැනීම ඉතා අසීරු කටයුත්තක් වෙලා තියෙනවා. මිනිස්සු මෙම ශාලාව සොයාගෙන නාගොඩ ප්‍රදේශයට පවා ගිහිපු අවස්ථා තියෙනවා. අනිත් එක පුස්තකාලය වෙනස් කරපු නිසා මිනිස්සු මිනින්දෝරු කාර්යාලයට යනවා. අඩුම තරමේ පුස්තකාලයට කියලා ඊතලයක් සහිත බෝඩ් එකක්වත් සවි කරන්න කටයුතු කරන්න. ඒ වගේම මෙම බහුකාර්ය ගොඩනැගිල්ලට උත්සව සඳහා මිළක් නියම කරලා තියෙනවා. ඒ මිළ තීරණය කරලා තියෙන්නේ සභාව පිහිටුවීමට පෙර. එම මිළ වැඩියි කියලා ජනතාව අතර මතයක් තියෙනවා. මෙහි ගාස්තුව අඩු කරොත් වැඩි වාර ගණනකට අපට ආදායමක් ලබා ගත හැකි වෙනවා. ඔවුන්ට ගැලපෙන ආකාරයට සාධාරන මිළක් මේ සභාවේදී තීරණය කරමු කියලා මම යෝජනා කරනවා. ඒ වගේම පෙර පාසල් සහ පාසල් වෙනුවෙන් සාධාරනයක් ඉටු කරන්න ඕන. ඒ මිළ ගණන් ඊට වඩා අඩු විය යුතුයි. පොදුවේ උපරිම මිළත් ඊට වඩා අඩු වුනා නම් හොදයි. එහි අඩුපාඩුකම් රාශියක් තියෙනවා. කර්ටන් එකක් නැහැ, තැම්පතු මුදල්ද අය කරනවා ඒ මොනවා අය කලත් රු. 15000.00 කට වඩා ඒ මිනිසුන් එහි අඩුපාඩුකම් සම්පූර්ණ කරන්න ඊට වඩා වියදම් කරනවා. ඒ පිළිබඳව සළකා බලන්න යැයි මම යෝජනා කරනවා.

ඒ වගේම උඩුගම නගරය ගැන කිව්වොත් වීථි පහන් සවි කරලා දෙන්න කියලා මම කලින් යෝජනා කලා. උඩුගම ප්‍රධාන බස් නැවතුම්පොල අසළ, දෙල්ලව නෑහිනිගල අකුරැස්සේ සිට එන ජනතාවට උඩුගම බස් නැවතුම්පලේ ඉන්න වෙලා තියෙන්නෙ කරුවලේ. අවුරුදු 4,5 කින් එහි ලයිට් හයිකරලා තිබුනෙ නැහැ. පසුගිය කාලයේත් සිද්ධ වුනේ නැහැ මේ ගැන සළකා බලන්න කියලා මම යෝජනා කරනවා.

අපේ සභාවට සෘජුවම අයිති නැති වුනත් අපි උඩුගම රෝහල ගැන කතා කරන්න ඕන. දෙල්ලව, මොරවක, ඕපාත වැනි ප්‍රදේශ රැසකින් විශාළ ජනකායක් එනවා. මේක තමයි මේ ප්‍රදේශයට තියෙන ලොකුම රෝහල , එක්ස්රේ ගන්න විකිරණ ශිල්පියෙක් සතියට දින දෙකක් පැමිනියත් දැන් එතුමා එන්නේ නැහැ. ඒ නිසා පොඩි දෙයටත් කරාපිටිය රෝහලට යන්න වෙලා තියෙනවා. ඒ පිළිබඳව අදාළ අංශ දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. විකිරණ ශිල්පියෙක් ඉල්ලීම් කිරීමට අපේ පළාත් පාලන ඇමතිවරයා දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

මම ඡන්දයට ඉදිරිපත් වූ ගෝණදෙනිය හගරන්වල ප්‍රදේශයට අයිති ඔයිල් ෆාම් වතුයායේ අපද්‍රව්‍ය ඇළට මුදා හැරීම දිගින් දිගටම සිදු වෙනවා. මේ පිළිබඳව අපි කලිනුත් කතා කළා. විශේෂයෙන් වහින දවස්වලට ඔවුන් අපද්‍රව්‍ය මුදා හරිනවා. ඒ නිසා පහළ කොටසේ කිසිම කෙනෙකුට එතනින් නාන්න බැහැ. කර්මාන්ත ශාලාවට පහල පැත්තේ මිනිසුන්ට නාන්න බැහැ. කර්මාන්ත ශාලාව පසු කර ගමන් මිනිසුන් නානවා. යම් කුට ව්‍යාපාරයක් මෙහි තියෙනවා. කලින් සිටි සභාපතිවරු මන්ත්‍රීවරු ඒකෙන් මොනාහරි ගත්ත කියලා තමයි අපට හිතෙන්නෙ. අපිත් එක්ක හිටපු අපි දන්න සභාපතිවරයෙක් ලෙස මේකට විසඳුමක් දෙන්න කියලා මම අපේ සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ මන්ත්‍රීවරුනුත් මේ සඳහා පරිසර දූෂණය වැළැක්වීම සඳහා පෙල ගැසෙන්න. වටවල වැව්ලි සමාගම ඔයිල් ෆාම් කර්මාන්ත ශාලාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම වහාම නතර කිරීමට ඉදිරි දින කිහිපයේදී කටයුතු කරන්න.

මෙහිදී මන්ත්‍රීවරයෙක් රු. 15000.00 ක දීමනාවකුත්, උප සභාපතිතුමන් ලෙස රු. 20000.00 ක දීමනාවකුත්, සභාපතිතුමන් ලෙස රු. 25000.00 ක දීමනාවකුත් අරගෙන අපි යම් වැඩක් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නෙ. ඉදිරියේදී අපි විසින් කරනු යෝජනාවලදී පක්ෂ විපක්ෂ භේදයකින්

තොරව යෝජනාවේ වැදගත්කම අනුව එයට සාධාරනත්වයක් ඉටු කරන්න යැයි ඉල්ලා සිටිමින් ඔබ සැමට වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම පළමුවෙන්ම පතිනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව තහවුරු කරනවා. ඉක්මණින් එම මාර්ගය සකස් නොකලොත් මාධ්‍ය තුල පවා එය ප්‍රදර්ශනය වෙයි. සමහර විට ගර්භනී මව්වරුන් පවා මෙම ස්ථානයෙන් ගමන් කරනවා. ඔවුන් මහත් අපහසුතාවයන්ට පත් වෙනවා එසේ නොවේවා කියා ප්‍රාර්ථනා කරනවා. මෙහි කාණු පද්ධතිය සකස් කිරීම ප්‍රාදේශීය සභාවෙන් කරන්න පුළුවන්. කාණු පද්ධතිය සකස් කරලා උඩින් එන වතුර පාර නතර කරලා දෙන්න පුළුවන්. මෙහි කම්කරු මහත්වරු යොදවලා ඒක කරල දෙන්න. අපට ඇස්තමේන්තුවක් සකස් කරලා දුන්නොත් අපිට සල්ලි සොයාගන්න පුළුවන් වුනොත් අපි සල්ලි ගෙනැල්ලා ඒකෙ කටයුතු කරනවා. දැනට තාවකාලිකව මේ වතුර පාර නතර කරන්න. ඊලගට මම තමුන්නාන්සේලාට ඉදිරිපත් කරනවා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල කොස් ගස පිළිබද ප්‍රශ්නය. 2016.05.10 දින අනතුරුදායක ගස ඉවත් කරන්න රු. 1000.00 ක් ගෙවා අයදුම්පත ඉදිරිපත් කරලා තියෙනවා. සභාපතිතුමත් මේ බව දන්නවා. ඒ 10 වෙනිදා ඉදිරිපත් කල අයදුම්පත 2016 තමයි ලේකම්තුමියට භාරදීලා තියෙන්නෙ. මහජන නියෝජිතයෙක් නැති කාලෙක තමයි මේ අයදුම්පත ඉදිරිපත් වෙලා තියෙන්නෙ, ඒ අතරතුර ලිපි කිහිපයක් හුවමාරු වෙලා තියෙනවා. ගස නිවෙසට අනතුරුයි කියලා තාක්ෂණ නිලධාරී වාර්තාවේ සදහන් වෙලා තියෙනවා. නමුත් මේ ගස කපා ඉවත් කලේ නැහැ කියලා නැවත වතාවක් දැනුම් දුන්නා. දෙවැනි වතාවෙත් මේ ගස ඉවත් වුනේ නැහැ. මෙහිදී දෙවියෝ මේ සදහා අතපාලා තියෙනවා. මේ මාසයේ 5 වෙනිදා මාස 02 ක දරුවත් ඇදේ තියාගෙන සිටින අවස්ථාවකදී මේ ගස කඩා ගෙන වැටුනා. මෙම දරුවා සැත්කමක් මාර්ගයෙන් බිහිවුනේ එම අවස්ථාවේදී මවගේ මැහුම් ගැලවුනා. අද වන විට මව රෝගී තත්වයෙන් සිටිනවා. අපේ රු. 1000.00 වගකීමවත් ඉෂ්ඨ වුනේ නැහැ. එමෙන්ම එම පියා කකුල කැඩිලා රෝගී තත්වයෙන් සිටින පුද්ගලයෙක්. මේක සභාපතිතුමාට අදාළ වෙන්නේ නැහැ. නමුත් සභාවේ පරිපාලනය පිළිබදව අපට තියෙන වගකීම මොකද්ද කියලා අපි මුලින් තේරුම් ගන්න ඕන. 2016 දීපු ඉල්ලුම්පත්‍රයට කොස් ගස කඩා වැටෙන තෙක් 2018 වෙනකම් තීරණයක් නැහැ. මේක තමයි සත්‍ය තත්වය. අපට සභාව යම් මාර්ගයකට යොමු කරන්න සිදු වෙනවා. මේ සභාවේ නිලධාරීන් 10,12 ක් ඉන්නවා. වාහන තියෙනවා. මේ වගේ අවස්ථාවකදී වාහනයකින් ගිහින් මේ කතාව ඇත්තද කියලා බලන්න තිබුණා. අද වාසනාවකට අර දරුවට, මවට කරදරයක් වුනේ නැති නිසා සභාපතිතුමා, අපි මෙහෙම ඉන්නවා. මම නැවතත් සභාවෙන් ඉල්ලන්නේ මෙවැනි දේවල් වෙන්න දෙන්න එපා. ඒ වගේම මේ පිළිබදව සානුකම්පිතව සළකා බලා එතුමන්ගේ වහළය ට සිදු වූ අලාභය සළකා බලා අලාභය හෝ අයදුම්පත්‍ර ගාස්තුව නැවත ලබා දීම පිළිබදව සළකා බලා කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ වෙරංගල මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල පරිදි කොඩි කණු ප්‍රශ්නය , නමුත් මෙහි ඉතිහාසයේ අපි යන විට කොඩි කණු 42 ක් තිබුණා. ඉන් පසු හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා 2016 දෙසැම්බර් මස කොඩි කණු 104 ක් දීලා තියෙනවා. නමුත් පසුගිය දවසක උත්සවයකට කොඩි කණු හොයන්න වෙනත් ආයතනයකට ගිහිල්ලා තියෙනවා. අපට දැන ගන්න ඕන මේ කොඩි කණු වලට වුනේ මොකද්ද කියලා . ඒ සම්බන්ධව වාර්තාවක් අපට අවශ්‍යයි. ඒ වගේම සමර්හට් 10 ක් සභාවට දුන්නා. දැන් නැහැ. මේකට වත්මන් සභාපතිතුමා වගකියන්න ඕන නැහැ. නමුත් යම් සභාපතිවරයෙක්, මන්ත්‍රීවරයෙක්, නිලධාරියෙක් හිටියද මේ තත්වයට ඔවුන්ද වග කිව යුතු වෙනවා. ඒ වගේම වතුර 2000 l තැම්පත් කරන්න පුළුවන් වතුර ටැංකි 17 ක් මෙහේ තිබුණා.

තවමත් එකක් ලසන්ත මහතාගේ නිවස අසල තියෙනවා. අනිත් 16 ට මොකද්ද සිදු වුනේ ඒ පිළිබඳව ලබන සභාවාරයේදීවත් වාර්තාවක් දෙන්න. ඒ වගේම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආනන්ද අබේවික්‍රම මහතාගේ ප්‍රතිපාදන යටතේ මේ සභාවට ලැබුණු සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් තිබුණා. එදා බණ්ඩාරනායකපුර පුහුණු කිරීමේ ආයතනයකුත් තිබුණා. නමුත් අද වන විට ඒවත් නැහැ. ඒ පිළිබඳවද සිදු වුන දේ අපට කියන්න. සංගීතය හා කලාව නගා සිටුවීමට සර්පිනාව, උඩැක්කිය ඇතුළු සංගීත භාණ්ඩ රැසක් තිබුණා. ඒ පිළිබද පොත්වල සටහන් වෙන්න ඕන. නමුත් මේ මොහොත වන විට මේවා තියෙනවද ඒවට වුනේ මොකද්ද කියන එක ගැටළුවක්. කරුණාකරලා ඒ පිළිබඳව මේ සභාවේ අලුත් මන්ත්‍රීවරු දැනුවත් කරන්න.

පසුගිය දවස්වල බී.ඕ. පහ ක්‍රීඩාංගණයේ අවුරුදු උත්සවයක් තියන්න ලේකම්තුමිය මුණගැහෙන්න කවුරුහරි කෙනෙක් ආවා. එවිට අපට මේක අයිති නැහැ. අපට අයිති 50% යි කියලා තිබුණා. මේක 100% ක් අයිති අපට ඔප්පු ඇති දැන් නැද්ද කියලා මම දන්නේ නැහැ. නාකියාදෙනියේ පර්චස් 80 ක ඉඩමෙන් එදා ශ්‍රීකුමාර් කියන අධ්‍යක්ෂවරයා අපට පවරා දී තියෙනවා. ඒ නිසා ඒ වගේ උත්තර දෙන්න එපා. මිනිස්සු අපහසුතාවයන්ට පත්වෙනවා. ඉන් පසු එය නිවැරදි කිරීමට ගරු සභාපතිතුමන් එකග වීම පිළිබඳව මම එතුමන්ට ස්තූතිවන්ත වෙනවා.

ඊළගට මත්ද්‍රව්‍ය ගැන කතා කලොත්, දැන් මත්ද්‍රව්‍ය වැහි වැහැලා. ඒවා අල්ලන්න බැහැ. පොලිසිය මේවා ඇල්ලුවහම සුරාබදු එකට දෙන්න ඕන. සුරාබදු එකට දුන්නම දඩය ගහනවා. නමුත් සුරාබදු එකෙන් දඩය ගැහුවට ඒ මුදල ලැබෙන්නෙ නැහැ. ජනතාව එවිට අසරණ වෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා නාගොඩ ප්‍රාදේශීය සභාවේ මේ කටයුත්ත ඉටු කිරීමට STF එකට භාර දෙන්න. වෙසක් පෝය දවසෙත් ප්‍රමෝෂන් එකක් තිබුණා. මොකද්ද පැකට් 10 ක් ගත්තොත් 1 ක් නොමිළේ. 20 ක් ගත්තොත් 2 ක් නොමිළේ. අද රටේ තත්වය මේක. අනාගත පරපුර වෙනුවෙන් අපට ලොකු වගකීමක් තියෙනවා. පක්ෂ භේදයක් නොමැතිව ප්‍රාදේශීය සභාවට ලොකු වගකීමක් තියෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳව හඩ නගා කියන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ජනතාව විසින් පෞද්ගලික වියදමින් සාදාගත් දිසානායක මාවතේ බර වාහන ගමන් කරනවා. ඒ නිසා පාර කැඩීමේ අවධානමක් තියෙනවා. එහි බර වාහන තහනම් කියා ගසා තිබෙන දැන්වීම් පුවරුව එක පැත්තකට පමණයි ගහලා තියෙන්නෙ. ඒම බෝඩ් එක දෙපැත්තටම සවි කිරීමට කටයුතු කරන්න කියා සහබන්දු මන්ත්‍රීතුමන් අදහස් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම මෙහේ වාහන ටික හරියට දුවනවද, වීථි ලාම්පු නිසි පරිදි සවිකරනවාද බල්න්න අවශ්‍යයි. උඟරල ඉන්නෙ මන්ත්‍රීවරු දෙන්නයි. තවත් ඉන්නවද මම දන්නෙ නැහැ. පසුගිය දවසක වීථි ලාම්පු වලට ගිය අවස්ථාවකදී අපි දෙන්නාම හැර වෙනත් අය ඔවුන්ගේ අවශ්‍යතාවයන් වලට අනුව නිවාස ලගට වීථි පහන් සවි කර ගෙන තියෙනවා. එදා හිටපු මන්ත්‍රීවරයෙක් කිව්වා මගේ ගෙදර ළගත් වීථි පහන් සවි කරන්න කියලා. දේශපාලඥද්ඥයන්ගේ ගෙවල් ළග වීථිපහන් දාන්නෙ නැහැ කියලා හරවගෙන ආවා. අපේ ගෙදර ගාවත් අවුරුදු 14 කින් වීථි ලාම්පුවක් දාගන්න බැරි වුණා. ඒ නිසා අපි දන්නවා තත්වෙ මොකද්ද කියලා. තමුන්නාන්සෙ කොරෙහි ලොකු විශ්වාසයකින් තමයි අපි සියළු දෙනාම ඉන්නෙ. තමුන්නාන්සේ ස්වාධීන පුද්ගලයකු ලෙස දේශපාලනය කරගෙන දේශපාලන අරමුණු කරා යන්න. ජනතාව වෙනුවෙන් වැඩ කිරීමේදී අපි සියළු දෙනාම එක අම්මගෙ දරුවො වගේ වැඩ කරමු කියන පණිවිඩය දෙමින් සැමටම ජය ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මුලින්ම මම ප්‍රකාශ කරනවා ලක්රුවන් මන්ත්‍රීතුමන් කල යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. විශේෂයෙන්ම ප්‍රදේශයේ මාර්ග පද්ධතිය පිළිබඳව එතුමා කල යෝජනාව ඉතා වැදගත් වෙනවා. මාර්ග පද්ධතිය නිවැරදිව හඳුනාගෙන ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ඒවා ගැසට් කර ඒ කටයුත්තට මුල පිරීමට අපේ ගරු සභාපතිතුමා මුලින්ම ඉදිරිපත් වෙනවා නම් එය ඉතා වැදගත් වෙනවා. මොකද පසුගිය කාලයේ එතුමටත් මාර්ගයක් පිළිබඳව ප්‍රශ්නයක් වුණා. ඉදිරියේදී එවැනි ප්‍රශ්න පැන නොනගින්න මාර්ග හඳුනාගෙන සියළු මාර්ග අපට පුළුවන් ආකාරයට ගැසට් කරන්න ඔබතුමා මැදිහත් වෙන්න කියලා මම මතක් කර සිටිනවා.

ඊළගට අපේ සහබන්දු මැතිතුමන් ප්‍රකාශ කල ප්‍රශ්ණවලට පිළිතුරක් ලබාදීමට මම කැමතියි. එයට මම කල් ගන්නවා.

තල්ගස්වල පොලේ කසල බැහැර කර ලීම ක්‍රමවත්ව සිදු වන්නේ නැහැ. මම මේ පොලට මාසයකට සැරයක් යනවා. පොලේ වෙළඳුන්ගේ කසළ බැහැර කර ලීම සිදු වෙනවා. නමුත් පොලේ මාළු වෙළඳපොලට යන මාර්ගයේ වාහන නතර කරන ස්ථානයක්, එහි ඇති කසල තල්ගස්වල ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවගේ කසල අනික දිරන කසල නොවෙයි. විවිධ ප්ලාස්ටික් උපකරණ, ඉටිකොළ වැනි අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් එහි තිබුණා. දින දෙක් මම මේ පිළිබඳව නිරීක්ෂණය කළා. අපේ කසල අයින් කරන අය පොලේ පවතින කසල අයින් කරත්, ඒ කසල ටික අරගෙන තිබුනේ නැහැ. මේ පිළිබඳව වෙළෙන්දන් විවිධ මැසිවිලි නගනවා. ඒක සත්‍ය සිද්ධියක්. අනික අපේ පොලේ මුරකරු හැමදාම එතන මුර කරන්නේ නැහැ. අවශ්‍යත් නැහැ. එහි ගේට්ටුව ඇරලා දාලා තියෙන නිසා කුනු ගෙනත් දානවා. ඔබතුමන් ඒ පිළිබඳ අධීක්ෂණය කර ඒ සම්බන්ධව තහනමක් සිදු කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. ඒ වගේම එලියෙන් ඇතුලට කුණු ගේන එක නතර කරන්න කටයුතු කරන්න.

ඒ වගේම අපේ ප්‍රදේශයේ කසල බදුන්වලින් කසල එකතු කිරීමට බදාදා දිනයන්හි සිදු කලද දැන් එම ප්‍රදේශයේ කුණු එකතු කරන්න යන්නේ නැහැ. මම ලේකම්තුමියන්ගෙන් ඒ ගැන විමසු විට ඇය ප්‍රකාශ කර සිටියේ කුණු දිරාපත් වන හා දිරාපත් නොවන ලෙස වර්ග කර ලබා දුන්නොත් පමණක් කුණු එකතු කරන බවත් නැතිනම් කුණු භාර නොගන්නා බවත්ය. එසේ කුණු වර්ග කර ලබා දෙන්න කියලා මිනිසුන් දැනුවත් කර ඇති බවද ප්‍රකාශ කර සිටියා. එම කසල බැහැර කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වුනු ප්‍රදේශවල නැවත කසල ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. නැත්නම් එය මහජන නියෝජිතයන් ලෙස අප පත්වී මාස 2 ක් ඇතුලත කසල නොගත්තා යැයි අපටත් දෝෂාරෝපනය කරාවි. තවද දිරන කසල වුනත් දින හත අටක් තියාගන්න බැහැ. ඒ නිසා එයට නිසි ක්‍රමවේයක් ඇති කරන්න. ඊළගට ලබන මාසෙ 12 වෙනිදා අප ප්‍රදේශයේ මාර්ග කිහිපයක් සංවර්ධනය කරන්න අපේ පන්සලේ හාමුදුරුවෝ කටයුතු කරගෙන යනවා. ගම්වැසියන් සමග එකතු වී කරන මෙම ශ්‍රමදානය මගින් මාර්ග 8 ක් හෝ 10 ආවරණය වෙනවා. මේ සඳහා සභාව සතු සම්පත් ලබන 12 වෙනිදා අපට ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාටත්, අපටත් විශාල සහයෝගයක් ගමේ හාමුදුරුවෝ ලබා දෙනවා. ඒ නිසා ඔබතුමාගේ දායකත්වය ලබන 12 වෙනිදා අපට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රීවරුන්ට කාර්යාලය තුළ ඉඩපහසුකම් සළසලා නැහැ. මම එන විට අපේ මන්ත්‍රීවරුන් පාරවල් ගානේ බස්හෝල්ට් ගානේ, ඉදිරියේ පොටිපෝවේ රැදී සිටියා. ඒ නිසා ඔබතුමා මැදිහත්වෙලා අපේ ගරු මන්ත්‍රීවරුන්ට වෙනමම කාර්යාලයක් සහ එම කාර්යාලයට අවශ්‍ය පුවත්පත් සපයා ලේකම්තුමිය හා ඔබතුමා පෙනෙන පරිශ්‍රය තුල ඉඩ ප්‍රස්ථාව සළසා දීමට කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා. අඩුම තරමේ එකවර 10,15 කට වත් අසුන් ගැනීමට හැකි වන ලෙස සකස් කරනවා නම් වඩා යෝග්‍ය වෙනවා.

ඒ වගේම වෙරංග මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල පරිදි උඩුගම ක්‍රීඩාංගණය පිළිබඳ ගැටළුවක් තියෙනවා. එහි අයිතිය සම්බන්ධව මම නිශාන්ත මන්ත්‍රීතුමා සමගත් කතා කළා. එම ක්‍රීඩාංගණය සකස් කිරීමේදී විජේබණ්ඩාර ඇමතිතුමාගේ ප්‍රතිපාදන ලබා ගෙන නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා තමයි සකස් කලේ. එය සකස් කිරීමෙන් පසු මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන් ඒ ගැන අයිතිවාසිකම් කිව්වා. එම ප්‍රශ්නය දිගින් දිගටම කල් ගියා. මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම්ටවත්, ප්‍රාදේශීය සභාවටවත්, ගමනාගමන මණ්ඩලයටවත් අයිති නැති ඉඩමක් ලෙස පැවතුනා දැන් මෙහි වර්තමාන තත්වය පිළිබඳව මම දන්නේ නැහැ. වර්තමාන අයිතිය ප්‍රාදේශීය ලේකම්තුමන්ටද, LRC එකටද කියලා මම දන්නෙ නැහැ. නමුත් එය ක්‍රීඩා පිටියක් වශයෙන් තවම කාටවත් පවරා දී නැහැ. මම වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමන්ට මතක් කර සිටිනවා. එහි කර්මාන්තශාලාවක් සකස් කරන්න අදහසක් තියෙනවානම් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සළසා ගැනීමට එම යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්න කටයුතු කරන්න කියලා.

ඒ වගේම උඩුගම පුරනැගුම පිළිබඳව මේ සභාවේ කතා කළා. ඇත්තටම අපේ ගිය ප්‍රාදේශීය සභා කාලය තුළ පුරනැගුම ඇස්තමේන්තුව මගින් පාර අද්දර ඉඩම තුළ පහළ තට්ටුවේ ව්‍යාපාරික ස්ථාන, ඒ වගේම ප්‍රාදේශීය සභා උප කාර්යාලය සමග උඩතට්ටුවේ රංගන ශාලාව සකස් කිරීමටත්, ඒ වගේම පාරෙන් උඩට ගිහින් රථගාල සකස් කිරීමට තමයි යෝජනා වී තිබුනේ. එහිදී ලද මුදල් ප්‍රමාණය මත එම කටයුතු කිරීමට නොහැකි වුණා. නමුත් එම අවස්ථාවේදී අපේ හිටපු විලේගේ සභාපතිතුමා මැදිහත් වී උඩුගම උප කාර්යාල භූමියේ එම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීමට කටයුතු කිරීම පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම අපි එය අගය කරනවා. ඒ ඉඩම වටේ සිටි වෙනත් අය තමයි ඒක භුක්ති වින්දේ. සමහරු පුද්ගලික මාර්ග සකස් කරලා තිබුණා. ඒ අසලම සොහොනකුත් ඉදි කරලා තිබුණා. ඒ පිළිබඳව සුහදව ඔවුන් සමග සාකච්ඡා කර මෙම ශාලාව ගොඩනැගීමට විලේගේ මැතිතුමන් කටයුතු කිරීම සම්බන්ධව ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා.

ඒ වගේම ප්‍රාදේශීය සභාවේ සම්පත් පිළිබඳව චන්ද්‍රා සහබන්දු මැතිතුමන් දීර්ඝ වශයෙන් කතා කළා. එබතුමන් එය දේශපාලන වේදිකාවේත්, උඩලමත්තෙ ප්‍රදේශයේදීත් කතා කළා. මම ඒක අහගෙන හිටියා. එතුමා ඒ පවසන කරුණු පිළිබඳව අපේ ගරු මන්ත්‍රීවරුන්ට වැටහීමක් ලබා දෙන්න ඕන අපි. ඔබතුමන් කියන කරුණු කාරනා 100% ක් මම පිළිගන්නේ නැහැ. මමත් ඒ පිළිබඳ සොයා බැලුවා. කොඩි කණු, වතුර ටැංකි සහ සමර් හට් පිළිබඳ මම සොයා බැලුවා සංගීත භාණ්ඩ ගැන නම් දන්නේ නැහැ. කොඩි කණු හා සමර් හට් පිළිබඳව මෙහි කිසිම ලේඛනයක සඳහන් වෙලා නැහැ. නමුත් වතුර ටැංකි කිහිපයක් අපට ලැබුණා. ගංවතුර ආධාරත් එක්ක 2000L වතුර ටැංකි ඒවායේ යම්කිසි අස්ථානගත වීමක් සිදු වෙලා තියෙනවා. එහිදී ඊට පිළිතුරු ලෙස සහබන්දු මහතා ප්‍රකාශ කලේ එම කොඩි කණු බද්දේගමින් ගෙනවිත් වදුරඹ පොළ අසලදී බා ගත් බවත්, එම අවස්ථාවේදී අපේ වාහනය ගොස් පටවා ගෙන ආ බවත්‍ය. එතුමා එම අවස්ථාවේදී එම සිදුවීම අධීක්ෂණය කල බවද වැඩිදුරටත් සඳහන් කරන ලදී. එසේ සිදු වී ඇත්නම් ඒ සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්විය යුතු බව උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේය. අපට ලැබිලා තියෙනවනම් එය අපේ සම්පතක්, ඒ සඳහා පරීක්ෂණ පවත්වන්න ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න අපෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඊළගට වතුර ටැංකි කිහිපයක්ම අපේ විද්‍යාලවලින් ලබා ගත්තා. සිරිසුනන්ද විදුහලට තාවකාලිකව ලබා දුන් වතුර ටැංකිය නැවත ලබා දුන්නේ නැහැ. තවත් පාසලකට ලබා දුන්නා. එය ලැබුනේත් නැහැ. මම දන්න තරමින් එකක් අස්ථාන ගත වෙලා තියෙනවා. විශේෂයෙන්ම කාර්යාලය වහපු මුරකරුත් නැති අවස්ථාවක තමයි මෙය සිදුවී තියෙන්නේ. ඒ පිළිබඳ දැනුවත් කරත් එම අවස්ථාවේදී පියවරක් ගන්න බැරි වුණා. මම දන්න තරමින් අපේ සභාවට සමර්හට් ලැබුනේ නැහැ. ලැබිලා තියෙනවනම් ඒ පිළිබඳව සොයා බලන්න ඒ සඳහා අපේ කැමැත්ත තියෙනවා. අපි ඔබතුමන්ගේ යෝජනාව අනුමත කරනවා. ඒ යම්කිසි නිලධාරියෙකු හෝ සභාපතිතුමෙක් හෝ

වගකිව යුත්තෙක් ඒවා භාරගෙන තියෙනවනම් ඒ සඳහා පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූල පියවර ගන්න.

මාපලගම පරණතානායම්ගොඩ රංග ශාලාව හැදුවෙ ඒ ස්වාමීන් වහන්සේලාගේ අනුදැනුම මත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් හා සභාපතිවරයෙක් පත් කළා. ඒ කාලෙ සභාපති හිටියෙ විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා එතුමා එහි ලයිට් බිල් ගෙව්වා. අපිට අධිභාර වෙලත් ආවා. මමත් ඒ අධිභාරයට අහුවුණා. අපි ඒ අධිභාරයෙන් බේරුනේ බොහොම අමාරුවෙන්. අපේ ප්‍රජා අයිතිය ආරක්ෂා කර ගත්තේ බොහොම අමාරුවෙන්. ඒ නිසා මේ සභාවේ යම් වංචාවක්, දූෂණයක් වෙලා තියෙනවානම් ඒ පිළිබඳව විධිමත්ව සොයා බලා සභාවට ඉදිරිපත් කර නීත්‍යානුකූලව කටයුතු කරන්න ඕනෑම මන්ත්‍රීවරයෙකුට හැකියාව තියෙනවා. ඒක මමත් අනුමත කරනවා. මගෙත් උපරිම සහයෝගය ලබා දෙනවා. එසේ නොමැතිව ආවේගශීලි වී කරුණු සොයා බලන්නේ නැතිව එසේ ප්‍රකාශ කිරීම නුසුදුසු වෙනවා. ඒ කරුණු පිළිබඳව පොත් පත් පරික්ෂා කරන්න අවශයයි. ඒ පිළිබඳව පොත්වල සඳහනක් නැතිනම් ඒ සම්බන්ධයෙන් කල යුතු දෙයක් නැහැ. මේ තොරතුරු පිළිබඳ කොළඹ ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානයෙන් පොත් පත් පරික්ෂා කර අදාළ තොරතුරු ගෙන ඒමට හැකියාවක් පවතී නම් කමක් නැහැ. ඒ හරහා අපිට පරික්ෂා කරන්න පුළුවන්. මේක රටේම පවතින ප්‍රශ්ණයක්. කොඩි කණු බෙදලා ඒවා අස්ථාන ගත වෙලා තියෙනවා, සිල්රෙදි බෙදූ බවට නඩු ගිහින් තියෙනවා. නමුත් මේ තරම් කාලයකට ඒ පිළිබඳව සොයා ගන්න බැරි වෙලා තියෙනවා. සහබන්දු මැතිතුමා දක්වන ලද අදහස් සම්බන්ධව අප සියළුම මන්ත්‍රීවරුන්ගේ උපරිම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. යටලමත්ත කොට්ඨාශයේ අනතුරුදායක ස්ථාන සඳහා වීථි පහන් සවි කරන ලෙසත්, දැනට ක්‍රියාත්මක නොවන වීථි පහන් අළුත්වැඩියා කරන ලෙසත් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම යටලමත්ත මංසන්ධියට හා ඒ අවට ප්‍රදේශවාසීන්ගේ ජල අවශ්‍යතාවය අනුව ජල යෝජනා ක්‍රමයක් දැනට ක්‍රියාත්මක වූ වැඩපිළිවෙල යටතේ සකස් කර දෙන ලෙසද මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම යටලමත්ත මාමනදොල මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක්. ඒවා සංවර්ධනය කිරීමට නොහැකි නම් පළාත් මාර්ගයකට හෝ මහා මාර්ගයකට පවරා දිය යුතුයි. අපේ සභාවට එවැනි මාර්ග ලොකු බරක් වෙනවා. ඒ වගේම මේ මාමනදොල මාර්ගයේ වටවල වැව්ලි සමාගමේ කටුපොල් ඇදීම නිසා මාර්ගය දැඩි ලෙස අබලන් වෙලා තියෙනවා. මෙය අළුත්වැඩියා කිරීමට ජනතාව උද්ඝෝෂණ කිහිපයක් සිදු කළා. එවැනි අවස්ථාවල ඒ සඳහා උදව් කරන්න වැව්ලි සමාගම ඉදිරිපත් වුණා. අපි සභාපතිතුමන් සමග ගොස් සාකච්ඡා කළා. අපි විසින් ඇස්තමේන්තුව සාදා දුන් පසු වැව්ලි සමාගම විසින් පාලම සාදා දීමට පොරොන්දු වුණා. ඒ පිළිබඳව අධීක්ෂණය කරන්න කියලා මම ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල පරිදි කටුපොල් ප්‍රශ්නය ගැන ඒ ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක් ලෙස පසුගිය ගංවතුර කාලෙත් මමත් දැඩි ලෙස මුහුනදුන් ප්‍රශ්නයක්. කටුපොල් සම්බන්ධව තරංග සුදර්ශන මන්ත්‍රීතුමාගේ අදහසට මමත් එකග වෙනවා. ගංවතුර කාලයට මොවුන් මේ අපද්‍රව්‍ය බැහැර කරන නිසා අපද්‍රව්‍ය ගංවතුර කාලෙට වැසි ජලය සමග මිශ්‍ර වෙලා අපේ බෙම්බඩ ප්‍රදේශයේ තේ වගාවට දැඩි හානිදායක තත්වයක් ඇති කරලා තියෙනවා. මටත් මේ ප්‍රශ්ණය නිසා ලක්ෂ 1 1/2 ක් විතර ලබා ගන්නා තේ වගාව විනාශ වුණා. අද වන විට මගේ තේ වගාව නැතිවෙලා ආදායම බිංදුවයි. නන්දන මන්ත්‍රීතුමත් ඒ බව දන්නවා. මේ ප්‍රදේශවල ඉන්නේ අපේ හිතමිත්‍රාදීන් මේ ප්‍රශ්නය නිසා ඔවුන්ගේ තේ වගාවන් විනාශයට පත්වෙනවා. එහෙයින් මේ කටුපොල් අපද්‍රව්‍ය ජලයට මුදාහැරීම නැවත්වීමට පියවරක් ගත යුතුම වෙනවා.

මාමනදොල මාර්ගය ගැන මම නැවත වරක් ප්‍රකාශ කරනවා. ඒක ප්‍රාදේශීය සභාව මගින් හෝ පළාත් සභාව මගින් නඩත්තු විය යුතු පාරක්. ඇත්තටම අපේ ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරුන් අද ප්‍රතිපක්ෂයක් ලෙස නොව අපිත් එක්ක සුහදව කතා කළා. සභාපතිතුමන්ට සහයෝගය ලබා දෙන බවත්, ශක්තියක් වන බවත් ප්‍රකාශ කළා. අපිට ඒ ගැන ඉතාම සතුටුයි. ඒ ගැන මම ඔබතුමන්ලාට ස්තූතිවන්ත වෙනවා. සභාව අපේ වුනාට ඔබතුමන්ලාගේ රජයක් තමයි තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා උනන්දු වෙලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලාට බලය තියෙන මේ වෙලාවේ අපේ මාමනදොල පාර සකස් කර දෙන්න කියලා මම නැවත් වාරයක් ඉල්ලා සිටිනවා. අපි ඊයෙ සාර්ථක මැයි රැලියක් පැවැත්වුවා. අපේ සභාපතිතුමන් බොහෝම උනන්දුවෙන් අපිව මෙහෙයවුවා. ඒ වගේම සම්පත් අතුකොරල මැතිතුමන් ඒ සභා සහයෝගය ලබා දුන්නා. ඇත්තටම මම සියළු ගරු මන්ත්‍රීවරුන්ට අපිත් එක්ක එකට වැඩ කිරීම සම්බන්ධව ස්තූතිවන්ත වෙමින් සැමටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී නෙළී වක්වැල්ල මහත්මිය :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ විපිත් සහබන්දු මන්ත්‍රීතුමාගේ අදහස්වලට මමත් එකග වෙනවා. ඒ වගේම යටලමත්ත මංසන්ධියේ තවත් අඩුපාඩු රාශියක් පවතිනවා. උඩුගම , ගාල්ල බස්රථවලට මගීන් ගොඩවන ස්ථානවල මගී ආවරණ නැහැ. එවුනට කඩමණ්ඩියේ අයිනට වෙලා තමයි ඉන්න වෙලා තියෙන්නෙ. ඒ නිසා ඔබතුමා මැදිහත් වී යටලමත්ත හන්දියේ මගී ආවරණ දෙකක් ඉදි කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මාමනදොල ඇළ සම්බන්ධව කතා කළා. පසුගිය දිනවල ප්‍රජා මූල සාකච්ඡාවලටත් ගියා. වැස්ස අවස්ථාවේදී යටලමත්ත හංදිය යටවෙනවා. යටලමත්ත මාමනදොල ඇල හරහා දෙපැත්තට ගස් කොලන් වැටිලා අපද්‍රව්‍ය දාලා ඇල හිරවෙලා තියෙන්නේ. මෙහිදී සභාව දැනුවත් වෙලා සභාවෙ සහයෝගයත් ලබා ගෙන ප්‍රජා ස්වේච්ඡා සංවිධානත්, වාරිමාර්ගයත්, පොලීසියත්, ගොවිජන සේවා එකටත් දැනුම් දී සියළු දෙනා ඒකරාශි වී සභාවට අයිති මේ ඇල ශුද්ධ කිරීම තුළින් මේ ගංවතුර පීඩාව ටිකක් හෝ අඩුකරගන්න පුළුවන්. ඒ නිසා මේ කාර්යය ඉටු කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම වීථි ලාම්පු ලබා දීම ගැන කතා කළා. වීථි ලාම්පු නැතුව පාරවල්වල අනතුරු වැඩිවෙලා තියෙනවා. මේ සම්බන්ධ ලිපියකුත් සභාවට ලබා දීලා තියෙනවා. එම වීථි ලාම්පු ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම කටුපොල් අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳවද මමත් ඒ කරුණු වලට එකග වෙනවා. උද්ඝෝෂන වලින් පසුව ටික දිනකට පමණක් සීමා වුනු අපද්‍රව්‍ය දැමීම දැන් නැවත එලෙසම සිදු වෙනවා. වතුර ගලපු ගමන් තේ විනාශ වෙනවා. ඒ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාමනදොල පාර ලග විශාල උද්ඝෝෂණයක් තිබුණා. සභාපතිතුමත් එතනට සම්බන්ධ වුනා. එතන ගෙවල් 20 ක් විතරයි ප්‍රාදේශිය සභාවට අයිති වෙන්නේ. එතනින් එහා වටවල වැවිලි සමාගමට තමයි අයිති වෙන්නේ. ඒ නිසා වටවල වැවිලි සමාගම සම්බන්ධ කර ගෙන තමයි මේක කරන්න වෙන්නෙ. එතැනින් එහා පාලම අනිවාර්යයෙන්ම වටවල වැවිලි සමාගමෙන් ඉදි කළ යුතුයි. එතුමන්ලත් සහභාගි කර ගෙන ඉක්මණින් පාර සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි නිශාන්ත නන්දන මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, 252-6478 කැබ් රථයෙන් පසුගිය තුන්වෙනිදා රාත්‍රියේ ටියුෂන් සම්බන්ධ පෝස්ටරයක් ගහමින් ගියා. සභාවේ රියදුරු මහතා සහ සේවක මහතුන් තමයි හිටියේ. මම ඒ පිළිබඳ අධීක්ෂණය කළා. ඔබතුමා යටතේ තිබෙන මේ වාහනවලින් කරන දේපල පිළිබඳව සොයා බලන්න.

අපේ හිටපු සභාපති සහබන්දු මහතා වතුර ටැංකි පිළිබඳව කතා කළා. අපේ ගරු මන්ත්‍රීවරුන් කණගාටුවෙන්න ඕන. මේ සභාවට මහජන ඡන්දයෙන් පත්වුනු මහජන නියෝජිතයින් තමයි ඒ වතුර ටැංකි ගෙදර අරගෙන ගියේ. ඒ බැරල් අස්ථානගතකලේ ඔබ වගේ ඡන්දයෙන් ආපු මහජන නියෝජිතයින් තමයි. අදටත් ඉන්නවා. කණගාටුවෙනවා. ඒ පිළිබඳව අපේ සභාපතිතුමත් දන්නවා. නම් ප්‍රකාශ කරලා අපහස කරන්න මම කැමති නැහැ. මහජන දේපල හිටපු මහජන නියෝජිතයින් අරගෙන කියා කියලා ඉතා වගකීමෙන් ප්‍රකාශ කරනවා. සුද්දො වගේ ඇවිත් මෙතන කතා කලාට ඇත්ත මේකයි. අපි මේ කටුපොල් ගානේ හැම දෙයක්ම කතා කරලා තියෙනවා.

ඒ වගේම වීථි ලාම්පු සවි කිරීමේ ක්‍රියාවලිය තාක්ෂණ නිලධාරි වාර්තාවක් අරගෙන නිසි ක්‍රමවේදයකට විධිමත්ම දැම්මොත් හොඳයි කියලා මම හිතනවා. වීථි ලාම්පුවක් දැමිය යුතු තැනට දැමිය යුතුයි. යම් මන්ත්‍රීවරයෙකුට වීථි ලාම්පු සවි කරනවානම් තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන නිසි ක්‍රමවේදයකට දාන්න. එවිට කාටත් දොසක් කියන්න දෙයක් නැහැ.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි වසන්ත කුමාරගේ මහතා :-**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම විනාඩි දෙකක වගේ කාලයක් ගන්නවා. පසුගිය 2017 අවුරුද්දෙ අපි රජයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපූර්ණ කරලා මාපලගම මහජන ක්‍රීඩාංගනයේ ඉදිරි වැට සහ ගේට්ටු දෙක සකස් කළා. අපි ගේට්ටු දෙක සවි කලා. ඒ වුනත් අපට ලැබුනු ලක්ෂ 10 ඇස්තමේන්තුවට ඒ ගේට්ටු දෙකේ පහල බිම සකස් කිරීම ඇතුලත් වුනේ නැහැ. එබැවින් එම ස්ථානයෙන් වාහන ඇතුළත් කිරීම අපහසුයි. අපේ සේවක මහතුන් දාලා හරි කමක් නැහැ ප්‍රධාන පාරේ සිට මහජන ක්‍රීඩාංගණයට ඇතුළු වන ස්ථානයේ ගේට්ටුව යට බිම සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගිය වුරුද්දේ සහ මේ අවුරුද්දේ අපි කරන ලද ඉල්ලීම් ලිපි අනුව මාපලගම ක්‍රීඩාංගණයේ පැවිලියන් එක සහ අනෙකුත් කටයුතු ඉදිකිරීම සඳහා යෝජනා අනුමත වෙමින් පවතිනවා. එම යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට අනුමත වී ඇති බව ප්‍රකාශ කරන්න කැමතියි. 2018 වර්ෂය තුළ මාපලගම මහජන ක්‍රීඩාංගණ සභාවේ ක්‍රීඩාංගණයක් ලෙස අපට ඒ කටයුතු සම්පූර්ණ කරන්න හැකිවෙයි කියලා මම හිතනවා.

ඒ වගේම මාපලගම මංසන්ධියේ වීථි ලාම්පු පිළිබඳව මතක් කරන්න කැමතියි. ලොකු අළුත් ලාම්පු තියෙන්නේ. ඒවා පිළිබඳව නැවත වරක් ඔබතුමා අධීක්ෂණය කරන්න. ඒවා පිච්චිලා අක්‍රිය තත්වයේ පවතින්නේ. මේ පිළිබඳව මම ලේකම්තුමිය සමග කතා කළා. එතුමියට කරන්න හැකි දේ කළා. දැන් අවශ්‍ය පහසුකම් තියෙන නිසා ඒ කටයුතු ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාර්ග සම්බන්ධව මන්ත්‍රීවරුන් කතා කළා. පසුගිය රජයේ තිබුන වගේ නෙමෙයි. පසුගිය අවුරුදු දෙක කාලය තුළ අපි මේ ප්‍රදේශයේ අත්‍යවශ්‍ය පාරවල් රාශියක් විශාල මුදලක් වැය කරලා ජනතා ඉල්ලීම මත සකස් කර දුන්නා. 2018 වර්ෂයේදී විශාල මුදල් ප්‍රමාණයක් එනවා අපේ පාරවල් සකස් කිරීමට.

මන්ත්‍රීතුමිය ප්‍රකාශ කල ආකාරයට තේ කම්හල පාර පිළිබඳව පසුගිය හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා සිටින අවධියේ  අපි නිතරම කතා කරපු පාරක් දැඩි ලෙස අබලන් වෙලා තිබුණා. කුරුපනාව තේ කම්හල මාර්ගයෙන් 80% ක් පමණ මගේ කොට්ඨාශය ආවරනය කරලා තියෙනවා. ඒ කොටස කොන්ක්‍රීට් කරලා තියෙනවා. 20% ක ප්‍රමාණයක් වගේ තමයි ඉතුරු වෙලා තියෙන්නෙ. ඒ ටිකත් මම මේ අවුරුද්දෙ ඉවර කරනවා. පසුගිය අවරුදු 17 කට කරන්න බැරි වුනු ඒ වගේ දැවැන්ත වැඩ කොටසක්  මේ අවුරුදු 2 ක කාලය තුල සිදු කළා. ඒ වගේම පරණතානායම්ගොඩ ප්‍රදේශයේ ගල්වාන - උඩුගම මාර්ගය, සෞඛ්‍ය මධ්‍යස්ථානය මාර්ගය මේ මාර්ග පිළිබඳව අපි කතා කලත් වැඩ කෙරුනේ නැහැ. නමුත් අපි ඒ වැඩ කොටස කළා.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිදුන්ගේ සහයෝගයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමන්  නොකරපු අති දැවැන්ත වැඩ කොටසක් අපි විසින් ඉටු කලා. නමුත් මහින්ද රාජපක්ෂ මහත්තයලගේ නම ඇහුවම කට්ටිය ඇවිස්සෙනවා. එයාලා තව කරන්න දෙන්න කියලා ඉල්ලනවා. ඒ දේශපාලන කතාබහ මම සභාව තුල ඇදලා ගන්නෙ නැහැ. සභාපතිතුමනි, අපි ලොකු වැඩ කොටසක් කරගෙන යනවා. ලක්රුවන් මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට පාරවල්වල කොන්ක්‍රීට් කැඩිලා බයිසිකල්වල පැච් යනවා. ඒ පාරවල් අපේ කාලෙ හදපුවා නෙවෙයි. අපේ වැඩ අපි හරියට කරනවා.

මම මුළින් ප්‍රකාශ කල යෝජනා සැලකිල්ලට ගන්න. අපිට ප්‍රතිපාදන ලැබෙන ආකාරයට අපි සභාවේ මාර්ගත් අනෙකුත් මාර්ගත් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලාගේ සහයෝගයත් අපට ලබා දෙන්න යැයි පවසමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු සභාපතිතුමන්ගේ මූලාසන කතාව :-**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.  මාධ්‍යවේදී මහත්වරුනි, මුලින්ම අපේ ගෞරවණීය මන්ත්‍රී මණ්ඩලය විසින් වටිනා අදහස් ඉදිරිපත් කරමින් සුහදව සභාවේ වැඩ කටයුතු කර ගෙන ගිය ආකාරය පිළිබඳ මම සතුටු වෙනවා.

ඒ වගේම සභාවේ පසුගිය සභාවාරයේදී ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳව පැහැදීමකින් තම අදහස් ප්‍රකාශ කිරීම ගැන මම ඉතා ගරු කරනවා. ඒ ගෞරවය හිමි විය යුත්තේ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයට. පසුගිය අප්‍රේල් 04 වෙනිදායින් පසුව මේ වන තෙක්ම ඉතාම කාර්යබහුලත්වයක් පැවතුනු අතර අවුරුදු උත්සව, වෙසක් උත්සව, හා මැයි දින සැමරුම් සියල්ලටම දායක වෙමින් ඒවායේ කටයුතු සිදු කරමින් තමයි මේ කටයුතුද සිදු කලේ. ඒ නිසා වාර්තාව ගැන සළකා බැලීමට කාලය මදි වුනා. නමුත් එවන් අවස්ථාවක ලේකම්තුමිය හා ඒ සම්බන්ධ නිලධාරීන් මේ කටයුත්ත හොදින් අධීක්ෂණය කර හොද වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව මම සතුටු වෙනවා.

ඒ වගේම අපි දෙරණ ටී. වී. සමග සම්බන්ධ වෙමින් දැවැන්ත අවුරුදු උත්සවයක් සිදු කළා. ඒ තුළින් අපේ සභාවට ලොකු ගෞරවයක් හිමි වුනා. පසුගිය දෙසතිය පුරාම මාධ්‍ය වලින් අපේ නම ප්‍රචාරණය වුණා. එම කටයුතු සංවිධානය කර ගැනීමට සම්බන්ධ වූ සියළු දෙනාටම මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම පසුගිය අප්‍රේල් 04 වෙනිදා ගරු මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධව දැනුවත් කිරීමක් සිදු කිරීමට නොහැකි වීම පිළිබඳව මම කණගාටු වෙනවා. මම මේ අවස්ථාවේ මාගේ පෞද්ගලික හැඳුනුම්කම මත අප ප්‍රාදේශීය සභා නාමය ඉහළින් ඔසවා තැබීමට කටයුතු කළ දෙරණ මාධ්‍ය ජාලයේ කළමනාකාර අධ්‍යක්ෂතුමන් වන මාධව මඩවල මැතිදුන්ට විශේෂ ස්තූතියක් පුද කර සිටිනවා.  දෙරණ මාධ්‍ය ආයතනයටත් මගේ විශේෂිත ගෞරවය පුද කර සිටිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, පොලීසියත්, ස්වේච්ඡා සංවිධානත් ඒකරාශි වී මේ කටයුතු සිදු කල නිසා අපේ ප්‍රාදේශීය සභාවෙන් මුදලක් වැය වුනේ නැහැ. සභාවේ වාහන හා නිලධාරීන් ඒ සඳහා සම්බන්ධ වුනු බව ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වගේම මාමනදොල මාර්ගය මුල් කරගෙන පැවති උද්ඝෝෂණයට මමත් සහභාගි වුණා. ඒ අවස්ථාවේ මම මහත් අපහසුතාවයට ලක් වුණා. 250 ක් 300 ක් පමණ ජනතාව ඒ සඳහා සහභාගි වුනා. මිනිසුන් මාව වට කරගෙන අදාල මාර්ගය සකස් කර දෙන මෙන් ඉල්ලා සිටියා. එතෙක් එම ස්ථානයෙන් ඉවත් නොවන බවද ඔවුන් විසින් ප්‍රකාශ කළා. මාමනදෙලෙ පාර ප්‍රාදේශීය සභාව සතු පාරක්. මම මේ පාරෙන් මළ ගෙදරක යන අවස්ථාවේදී මේ මාර්ගයේ තත්වය හොඳින් දැක්කා. ඇත්තටම මේ උද්ඝෝෂණය හරිනම් අපි කියලා කරවගන්න තරම් වටිනවා. ඒ තරමටම මාර්ගය අබලන් තත්වයකයි පවතින්නේ. ඉහළ මිනිසුන්ගේ ඇස් ඇරෙන්නෙ උද්ඝෝෂණ කල විටයි. නමුත් මිනිස්සු හිතාගෙන ඉන්න ආකාරයට අද උද්ඝෝෂණ තිබ්බා කියලා හෙට වෙනකොට පාරවල් කාපට් කරන්නෙ නැහැ. මේ අවස්ථාවේදී අපි වෙනුවෙන් කතා කරන්න මැති ඇමති කෙනෙක් ඉදිරිපත් වුනේ නැහැ. වර්ථමාන අපේ පළාත් සභා අමාත්‍ය රාසපුත්‍ර ඇමතිතුමාව දුරකථනයෙන් සම්බන්ධ කර ගන්න උත්සාහ කරත් සම්බන්ධ කර ගන්න බැරිවුණා. නමුත් එතුමන්ගේ පෞද්ගලික ලේකම් තුමා සම්බන්ධ කර ගත්තා. එතුමන්ගේ පෞද්ගලික ලේකම්තුමන් ප්‍රකාශ කලේ ප්‍රාදේශීය සභා මාර්ගයක් නඩත්තු කිරීමට පළාත් සභාවට හැකියාවක් නොමැති බවයි. නමුත් මීට කලින් එවැනි නඩත්තු කරන අවස්ථා පැවතුනා. මේ මාර්ගය කලින් පළාත් සභාවෙන් නඩත්තු කල මාර්ගයක් වෙනවා. පසුව ඒ සම්බන්ධීකරණ ලේකම්තුමා පළාත් සභා මන්ත්‍රී යෝජනාවක් ලෙස මෙය ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියා. එම ජනතාව වෙනත් ඉහල මන්ත්‍රීවරයෙක් පැමිණ ලිඛිත පොරොන්දුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියත් ප්‍රාදේශීය සභා සභාපති ලෙස මෙහි සිටින ප්‍රධාන නිලධාරියා වන මම 15 වනදා තෙක් යම් තීරණයක් ගැනීමට කල් ඉල්ලා ගත්තා. 15 වෙනිදායින් පසුව පිළිතුරක් නොලදහොත් මටත් ඔවුන් සමග උපවාස කිරීමට සිදුවෙනවා. පසුව නාකියාදෙනිය වතුයාය සමග සාකච්ඡා කරලා එතුමන්ලාගේ සහයෝගය ඇතුව පාර සකස් කිරීමට එකග වුණා. දැනට කාණු කපා ඔවුන් ඒ කටයුතු කරගෙන යනවා. නමුත් ඔවුන්ට අපේ සහයෝගය අවශ්‍ය වෙනවා.

කටුපොල් ප්‍රශ්නයටත් ඉදිරියේදී උද්ඝෝෂණ ක්‍රියාත්මක වීමට නියමිතව තිබෙනවා. ලබන 11 වෙනිදා ප්‍රාදේශීය සභා සභාපතිවරු රැස්වී ඒ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීමට අපේක්ෂිතව තියෙනවා. කටුපොල් ව්‍යාපාරයේ පවතින අක්‍රමිකතා පිළිබඳ එහිදී සාකච්ඡා කරනවා. ඉඩම් ප්‍රමාණයෙන් 20% ක් කටුපොල් වැවීමේ හැකියාව පවතිනවා. සමහර ස්ථානවල 80% ක් දක්වා ප්‍රතිශතයකට කටුපොල් වගා කර තිබෙන බව ප්‍රකාශ කර සිටිනවා. ඒ ප්‍රශ්නය කුමක් වුවත් පාර සකස් කිරීමට එතුමන්ලාගේ සහය අපට ලැබෙනවා. එසේ නැත්නම් එතුමන්ලාගේ වාහන මේ පාරේ ගමන් කිරීම පිළිබඳවද සළකා බැලීමට සිදු වන බව මම ඔවුන්ට ප්‍රකාශ කළා. නෙලී මන්ත්‍රීතුමිය ඒ පිළිබඳව දුටු බව ප්‍රකාශ කළා. ඒ අවස්ථාවේදී මන්ත්‍රීතුමිය එතනට සහභාගි වුනා නම් වටිනවා. විජිත් සහබන්දු මැතිතුමත් ඒ සඳහා සහභාගි වුණා. ඒ අවස්ථාවේ සභාවේ මූල්‍යමය තත්වය පිළිබඳවත් අපට තනිවම මෙය කිරීමට අපහසු බව ඔවුන් පිළිගත්තා.

ඇත්තටම සභාවේ ආදායම මසකට ලක්ෂ 3 ක් වගේ ගාණක්. තරංග මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට මන්ත්‍රීදීමනා සහ දුරකථන දීමනා ලබාදෙන්නේ ඉතා අපහසු තත්වයකින්. ඉතින් අපට බල්බ් එකක් දාගන්න වෙන්නෙ මේ ඉතුරු භාගයෙන් තමයි. ඒ නිසා තමන් දන්නා හඳුනන මැති ඇමතිවරුන්ගෙන් ප්‍රතිපාදන ලබා ගෙන ප්‍රාදේශීය සභාව හරහා යම් වැඩක් ඉටු කිරීමට කටයුතු කරන්න කියලා මම අපේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒතුළින් අප ප්‍රාදේශීය සභාවේ නම ජනතාව අතරට යනවා.

ඒ වගේම අපේ සභාව සතුව පවතින මාර්ග, ඉඩම් හා අනෙකුත් දේපළ පිළිබඳව අපේ ගරු මන්ත්‍රීවරුන් නොදැනුවත් වන අතර ඒ පිළිබඳව සමීක්ෂණය කර පොත්පත්වල එම තොරතුරු පවත්වා ගැනීම වැදගත් වෙනවා. ඒ පිළිද සමීක්ෂණ පවත්වා අදාළ තොරතුරු යාවත්කාලීන කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියද අපව දැනුවත් කළා. එබැවින් කොට්ඨාශ භාර සිටින අපේ ගරු මන්ත්‍රීවරුන් තම කොට්ඨාශවල පවතින සභාවට අයිති සියළු දේපල තොරතුරු, සභාව සතු මාර්ග, ඉඩම්, ප්‍රජා ශාලා, පොදුළිං, වැසිකිළි, යනාදිය පිළිබඳ තොරතුරු රැස් කර අප සභාව දැනුවත් කරන ලෙස මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අප සභාව සතු අනිකුත් අය

භුක්ති විඳින සම්පත් සභාවට පවරා ගත යුතුයි. තවත් සමහර දේවල් අපේ යැයි පැවසුවද නිසි ක්‍රමවේදයකට සභාවට පවරා ගෙන නැහැ. සමහර දේපල පවරා ගැනීමේ අවසන් අදියරේ පවතින බව ලේකම්තුමිය විසින් ප්‍රකාශ කළා. ඒ වගේම ඇප්තොප්වත්ත අක්කර 5 පිළිබඳවත් පවරා ගැනීමේ කටයුතු කරලා තියෙනවා. ඒ නිසා අපට ඇමතිතුමන් සම්බන්ධ කර ගෙන ඒ කටයුතු කරන්න හැකියාව ලැබේවි. අපේ කොම්පොස්ට් එක ඇතුලේ ඉඩමේ කොන්ත්‍රාත්කරුවන් පොල් කඩා ගෙන යන බව ප්‍රකාශ කළා. අපට ඒ තුළින් හොද ආදායමක් ලබා ගන්න පුළුවන්. පෙරදී අපි පොල් ගෙඩි 1000, 2000 ක් කඩලා තියෙනවා. ඒ පිළිබඳ අපි ඉදිරි කටයුතු කරනවා. අපි දේශපාලනයෙන් තොරව පෞද්ගලිකව කතා කරන අවස්ථාවන්හිදී ඉඩම් සම්බන්ධ නිලධාරීන් සහ ඇමතිතුමන් අපට සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කළා.

ඒ වගේම අපේ හිටපු උප සභාපති අජිත් එඩේරආරච්චි මැතිතුමන් ශාලාව වායුසමීකරණය කර දෙන ලෙස ඉල්ලා සිටියා. ඇත්තටම කණගාටුයි. වෙරංග මන්ත්‍රීතුමන් එළියට යන විට සුභාෂි මන්ත්‍රීතුමියට නැගිටීමට සිදුවෙනවා. මේ ශාලාව තුළ ඉඩකඩ ප්‍රමාණවත් නැහැ. මේ ශාලාව සකස් කර ගැනීම පිළිබඳව ගිය සභාවාරයේදීත් අපි කතා කළා. එය නියම ප්‍රමිතියකට ඉටු කර ගන්න අපට බැහැ. යථා කාලයේදී මෙහි ඉඩප්‍රස්තාව සාදා ගැනීමට කටයුතු කරනවා. වෙනත් සභාවලට සාපේක්ෂව අපි ඉදගෙන ඉන්න ආකාරය දුටුවිට ඇත්තටම අපිට කණගාටුවක් ඇතිවෙනවා. මේ ගොඩනැගිල්ල සකස් කිරීම සදහා ඇස්තමේන්තු සකස් කර අවසානයි. එය ඔබතුමන්ලත් දකින්න ඇති. පළමු තට්ටුව ඉදි කිරීමට එක් කෝටි පනස් ලක්ෂයක් වැය වෙනවා. මේ ඇස්තමේන්තුව මහ ඇමතිතුමන්ට ඉදිරිපත් කරන්න වෙනවා. මේ කටයුත්ත ක්ෂණිකව ඉටු කිරීමට නොහැකි වුනත් අපි ඒ සදහා ඉදිරි කටයුතු කරනවා.

කොඩිකණු පිළිබඳව චන්ද්‍රා සහබන්දු ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කළා. කොඩි කණු අපේ සභාවට භාර ගෙන නැහැ. ඉදිරියේදී මම ඒ පිළිබඳ දැනුවත් වී ඔබතුමන්ලා සියළු දෙනාම ඒ පිළිබඳව දැනුවත් කිරීමට මම කටයුතු කරනවා. පෘථග්ජන අපි අතින් වැරදි වෙන්න පුළුවන්. නමුත් මම සියළුම කටයුතු ඉතා විනිවිදභාවයෙන් කරන්න කැමතියි. මේ දේශපාලන කටයුතුවලදී අපේ අතින් වැරදි සිදුවෙනවා. ඉදිරි කටයුතු ඉතාමත් විනිවිදභාවයකින් කරන්න මම බලාපොරොත්තු වෙනවා. අපේ මන්ත්‍රීවරු 27 දෙනාත් අවංකභාවයකින් යුතුව කටයුතු කරන බව මට පෙනී යනවා.

ඒ වගේම අර කොස් ගස කඩා වැටුණු ස්ථානයට මම ගියා. නිලධාරීන් කටයුතු කරන්නේ දේශපාලනයට නොවෙයි. නීතිරීති වලට අනුවයි. ක්ෂණික තීරණ ගන්නේ නැහැ. නමුත් මෙහිදී අප සියලු දෙනාගේම වාසනාවට ගසේ අත්ත පමණක් එතනට පාත්වුණා. සහබන්දු මැතිතුමනි තවත් එවැනි ප්‍රශ්න බොහෝමයක් තියෙනවා. ගම්මැද්දේගොඩ ප්‍රදේශයේද නඩු ඉඩමක එවැනි ගස් බොහොමයක් තියෙනවා. මේ ප්‍රශ්නයේදී ග්‍රාම නිලධාරී , ප්‍රාදේශීය ලේකම්, යන දෙදෙනාම සම්බන්ධ විය යුතු වුවත් ගස් කැපීමට ප්‍රාදේශීය සභාවට බල කර සිටිනවා. නමුත් අපට නීත්‍යානුකූල ක්‍රමය තමයි ක්‍රියාත්මක කිරීමට සිදු වෙලා තියෙන්නේ. ඉදිරියේදී අපි ඉතාම සාධාරණව එම කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.

අපේ සමහර කොට්ඨාශවල මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. ඒ මන්ත්‍රීවරු එකතුවෙලා ශ්‍රමදාන මට්ටමින් වැඩ කටයුතු කරන්න. එම ශ්‍රමදාන කටයුතුවලට අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. අපේ ආදායම් තත්වය අනුව බැකෝ යන්ත්‍ර යෙදීමට අපට අපහසුයි. විවිධ දින වකවානු කතා කරගෙන එම කටයුතු යොදා ගන්නා මෙන් මම අපේ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගයාන් මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ස්ථානය පිළිබඳව අද දින පළාත් සභාවේ කතා කරන බව සිසිර කුමාරරත්න මහතා කතා කළා. අද දිනත් එම ස්ථානයේ වතුර පවතිනවා යැයි ප්‍රකාශ කළා.

ඒ වගේම පානීය ජල යෝජනා ක්‍රම පිළිබඳව අදාළ යෝජනාවන් ඉදිරිපත් කරන්න කියලා මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව අපට ලිඛිතව ලබා දෙන්න. එවිට අවශ්‍යතාවය අනුව එම යෝජනා පෙල ගස්වා ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතිනවා.

ඒ වගේම අපේ මාපලගම මහජන පුස්තකාලය අවට පරිසරයේ පවතින කැපිය යුතු අඹ ගස අපේ හිටපු ලේකම්තුමෙක් වන අතුකෝරල මහතාට අයිතිය පවතිනවා. අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමත් මේ බව ප්‍රකාශ කළා. එම ගස ඉවත් කිරීමේ කටයුතු අපි ඉදිරියට ඉටු කරනවා. මාපලගම මෙන්ම අපේ හැම ස්ථානයකම අඩුපාඩු රාශියක් පවතිනවා. රංජිත් ජයවීර මන්ත්‍රීතුමනි ඔබතුමාලට හැකිනම් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අපේ පුස්තකාලයට පරිශ්‍රයක් ලබා දෙන්න.

ඒ වගේම අපේ වෙරංග මන්ත්‍රීතුමන් ඉතා වටිනා යෝජනාවන් ඉදිරිපත් කළා. අපේ මනසට එවැනි යෝජනා ආවෙ නැහැ. අපි ඒ යෝජනා ඉටු කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමු.

ඒ වගේම වීථි ලාම්පු සවි කිරීමට ලේකම්තුමිය විසින් ක්‍රමවේදයක් සකස් කරලා තියෙනවා. සතියේ දින පහේම වීථි පහන් සවි කරන්න යනවා. ඒ වීථි පහන් සවි කර අවසන් වූ පසු නැවත මුල සිට පිළිවෙලට වීථි පහන් සවි කරන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බව එතුමා ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ තාක්ෂණ නිලධාරී අධීක්ෂණය යටතේ වීථි ලාම්පු සවි කරන බව වැඩිදුරටත් එතුමා ප්‍රකාශ කරන ලදී. බල්බ් එකක් රු. 500.00 ක් 600.00 ක් වෙනවා. ඒ නිසා අත්‍යවශ්‍යම ස්ථානවලට වීථි ලාම්පු සවි කල යුතුයි. ඉදිරියේදී එම කටයුතු නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙනවා.

සියළුම ගරු මන්ත්‍රීවරුන් පවසන ලද කරුණු පිළිබඳව මම දැනුවත් වුනා. ඒ පිළිබඳව මම ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඔබතුමන්ලාගේ ප්‍රශ්ණ ඉදිරිපත් කරන්න. සංග්‍රහ කටයුතු සම්බන්ධයෙන් යම් අඩුපාඩුවක් සිදුවුනානම් ඒ පිළිබඳව සමාව අයදිනවා.

මෙහිදී ආයුර්වේදයේ අඩුපාඩු ඉක්මනින් සපයා දීම පිළිබඳවද සාකච්ඡා කරන ලදී. වෛද්‍ය නලාව හා රෝගීන් බලන ඇඳ ඒ අතරින් වැදගත් බවත්, එය ඉදිරියේදී වෙනත් ආයතනයක් සම්බන්ධ කර ලබා ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම මින් පසු පෙ.ව. 9.00 වන විට සභා රැස්වීමට පැමිණෙන මෙන් ඉලල්ලා සිටි අතර මන්ත්‍රී යෝජනා අඩුම තරමින් දින 10 කටවත් ප්‍රථමයෙන් සභාවට භාරදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

පැමිණි සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් සැමටම ජය පතමින් අද දින සභාවේ කටයුතු අවසන් කරනවා.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභාව.

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී. දිනය:- ................................